# අයවැය කථාව 2017

ගරු සභාපතිතුමනි,

ගරු අමාත්‍යවරුනි,

ගරු විපක්ෂ නායිකාතුමියනි,

ගරු මන්ත්‍රීතුමියනි,

ගරු මන්ත්‍රීතුමනි,

මධ්‍යම පළාත් සභාවේ හයවන පළාත් සභාවේ හතරවන අයවැය ලේඛනය ඉදිරිපත් කරන මේ අවස්ථාවේ සහභාගී වී සිටින තමුන්නාන්සේලා සියලුදෙනාම ඉතාමත් ගෞරවයෙන් පිළිගනිමි. නව රජයක් බලයට පත්වී වසර දෙකක් ගතවීමට ආසන්න මොහොතක නැවත වරක් අප මධ්‍යම පළාත් සභාවේ ඉතාම වැදගත් ලේඛනය, එනම් ඉදිරි වර්ෂය සඳහා වූ අයවැය ලේඛනය තමුන්නාන්සේලා වෙත ඉදිරිපත් කිරීමට හැකි වීම මහත් ගෞරවයක් කොට සලකමි.

මෙරට පළාත් සභා ක්‍රමය ආරම්භයේ සිට පළාත් මට්ටමින් මහභාණ්ඩාගාරය මගින් ප්‍රාග්ධන අරමුදල් ලබා දෙමින් සෑම පළාතකටම සමතුළිත සංවර්ධනයට අදාළ ප්‍රාග්ධන ආයෝජනයක් සිදු කිරීමට අවශ්‍ය පසුබිම සැකසී ඇති මොහොතක රාජ්‍ය අරමුදල් ඉතාමත් අරපරිස්සමෙන් වඩාත් කාර්යක්ෂම හා ඵලදායී ලෙස ආයෝජනය කිරීමට 2017 වර්ෂය තුළ දී සිදුවනු ඇත.

මෙම වර්ෂයට සාපේක්ෂව 2017 වර්ෂය සඳහා අපේ පළාත් සභාවට වෙන් වී ඇති ප්‍රාග්ධන අරමුදල් ප්‍රමාණය 57% කින් පමණ අඩු වී තිබෙනවා. 2016 වර්ෂයේ දී රු.මි. 5174 වූ ප්‍රාග්ධන ආයෝජනය 2017 වර්ෂය සඳහා රු.මි. 2222 දක්වා රු.මි. 2952 කින් පමණ අඩු වි තිබෙනවා.

පුනරාවර්තන වියදම් සඳහා ද මුදල් ඌනතාවයක් තිබෙනවා. 2016 වර්ෂයේ දී රු.මි. 29,418ක් වූ පුනරාවර්තන වියදම (පෞද්ගලික පඩිනඩි හා වෙනත් වියදම් ද ඇතුළත්ව) 2017 වර්ෂයේ දී රු.මි. 32,800 දක්වා ඉහළ ගොස් තිබෙනවා. ඒ අනුව 2017 වර්ෂයේ දී පෞද්ගලික පඩිනඩි සඳහා දැරිය යුතු

මුළු වියදම රු.මි. 26,280ක් ලෙස ඇස්තමේන්තු කර තිබෙනවා. 2017 වර්ෂය සඳහා වෙනත් පුනරාවර්තන වියදම් ලෙස රු.මි. 6,520ක් ඇස්තමේන්තු කර තිබුණත් එයින් රු.මි. 3,663ක මුදලක් පමණක් මහා භාණ්ඩාගාරයෙන් වෙන් කර තිබෙනවා. ඒ අනුව ඇස්තමේන්තුගත පුනරාවර්තන වියදම්වලින් රු.මි. 2,857 හිඟයක් පවතිනවා. මෙය අපි 2017 වර්ෂයේ ගලපා ගතයුතු ප්‍රධාන අභියෝගයක් වෙනවා. මේ අනුව ප්‍රාග්ධන හා පුනරාවර්තන වියදම් වෙනුවෙන් 2017 වර්ෂයට මෙම පළාත් සභාවට රු.මි. 32,166ක මුදලක් වෙන් වී තිබෙනවා.

ඒ අනුව අප මුහුණ පා ඇති ප්‍රධානතම අභියෝගය වන්නේ රාජ්‍ය ආදායම වැඩිකර ගනිමින් හා නිසි මූල්‍ය කළමනාකරණය තුළින් ප්‍රාග්ධන ආයෝජනයන් හා පුනරාවර්තන වියදම් පවත්වාගෙන යාමට කටයුතු කිරීමයි.

ගරු සභාපතිතුමනි,

පසුගිය අයවැය ඉදිරිපත් කිරීමේදී අනුගමනය කළ ශූන්‍ය පාදක ක්‍රමය හෙවත් Zero Based Budget ක්‍රමවේදය අනුව මධ්‍යම පළාත තුළ රාජ්‍ය අරමුදල් ඉතාමත් ඵලදායී ලෙස ආයෝජනය කිරීමට හැකි විය. ඒ තුළින් පළාතේ ජනතාවට උපරිම ප්‍රතිලාභ  ලබාදීමට කටයුතු කරන ලදී. මෙවර අයවැය සකස් කිරීමේ ප්‍රධානම අභියෝගය වූයේ ප්‍රාග්ධන ආයෝජනය සඳහා වෙන් කළ ප්‍රතිපාදන සීමාසහිත වීමයි. එසේ වුව ද විවිධ උපාය හා උපක්‍රමික ක්‍රම අනුගමනය කරමින් පළාතේ සමාජ ආර්ථික සංවර්ධනය ඉහළ නංවා ගැනීමට විශේෂ අවධානය යොමු කරමින් ඉදිරි වසර සඳහා කටයුතු කළ යුතුව තිබෙනවා.

මෙලෙස 2017 වර්ෂයේ දී මධ්‍යම පළාතේ ප්‍රජාවගේ ජීවන තත්ත්වය නංවාලීම උදෙසා කටයුතු කිරීමේ දී ජාතික හා ජාත්‍යාන්තර වශයෙන් අවධානය යොමු වී ඇති කරුණු කාරණා කෙරෙහි ද අවධානය යොමු කළ යුතුයි. අතිගරු ජනාධිපතිතුමන් විසින්  2017 වර්ෂය "දිළිඳුකම පිටු දැකීමේ වර්ෂය" ලෙස නම්කර තිබෙනවා. එය යථාර්ථයක් බවට පත් කිරීමට පළාතක් විදිහට අපි කටයුතු කළ යුතුය.

2015 වර්ෂයේදී එක්සත් ජාතීන්ගේ 70 වන මහ සමුළු සැසිවාරයට සමගාමීව පවත්වන ලද තිරසාර සංවර්ධන සමුළුවේදී සාමාජික රටවල් 193ක එකඟතාවය ඇතිව තිරසාර සංවර්ධනය සඳහා වන වර්ෂ 2030 න්‍යාය පත්‍රය සම්මත කරනු ලැබීය. මෙම එකඟතාවයට අත්සන් කළ රටවල් අතර අප රටද වන අතර තිරසාර සංවර්ධන අරමුණු 17කින් හා එම අරමුණු සාක්ෂාත් කර ගැනීම සඳහා ඉලක්ක 169කින් ද මෙම එකඟතාවය සමන්විත වෙනවා. ශ්‍රී ලංකාව තුළ මෙය ක්‍රියාත්මක කිරීමේදී අරමුණු 08ක් සෘජුවම පළාත් සභා විෂය පථයට සම්බන්ධ වේ. 2017 මුදල් වර්ෂය මෙම අරමුණු හා ඉලක්ක සාක්ෂාත් කර ගැනීමේ පදනම් වසර කරගත යුතුයි.

දිළිඳුකම තුරන් කිරීම, කුසගින්න හා මන්දපෝෂණය ශූන්‍ය බවට පත් කිරීම, සැමට මනා සෞඛ්‍ය තත්ත්වයක් සහ සුබසාධනය සැලසෙන පරිදි ඒඩ්ස්, ක්ෂය රෝගය, මැලේරියාව සහ අනෙකුත් බෝවන රෝග හා වසංගත රෝග තුරන් කිරීම, ගුණාත්මක අධ්‍යාපනයක් ලබාදීම, පිරිසිදු පානීය ජලය හා සනීපාරක්ෂක පහසුකම් ලබාදීම, සාධාරණ මිලකට සැමට බලශක්තිය ලබාදීම, ජනවාර්ගිකත්වය හා ස්ත්‍රී පුරුෂභාවය වැනි කරුණු නොසලකා සෑම දෙනෙකුම ආර්ථිකමය වශයෙන් ශක්තිමත් කිරීම, වනාන්තර තිරසාර ලෙස කළමනාකරණය කිරීම සහ වන විනාශය නතර කිරීම යන ඉලක්ක සපුරා ගැනීමට මධ්‍යම පළාත් සභාවේ විශේෂ අවධානය යොමු කළ යුතු වෙනවා. පළාත් සභාවක් ලෙස ඉහත අරමුණු හා ඉලක්ක ලඟා කර ගැනීමේදී අප දැනටමත් සතුටු විය හැකි මට්ටමක සිටින බව කිව යුතුයි. සෞඛ්‍ය, අධ්‍යාපනය, පානීය ජලය හා සනීපාරක්ෂක කටයුතු, විදුලිබලය වැනි ක්ෂේත්‍රවලින් සාපේක්ෂව අප පළාත වඩාත් ඉදිරියෙන් සිටිනවා. එහෙත් වඩා වැඩි අවධානයක් යොමු කළ යුතු ක්ෂේත්‍ර/අංශ කිහිපයක් තිබෙන බව ද කිව යුතුයි. දරිද්‍රතාවය තුරන් කිරීම, කුසගින්න හා මන්දපෝෂණය තුරන් කිරීම, බෝවන හා බෝ නොවන රෝග තුරන් කිරීම, ආර්ථික වශයෙන් ප්‍රජාව ශක්තිමත් කිරීම, පරිසර සංරක්ෂණය වැනි ක්ෂේත්‍රවලින් අප තවදුරටත් ඉදිරියට යා යුතුව තිබෙනවා.

ගරු සභාපතිතුමනි,

පළාතේ ප්‍රජාවගේ සුබසිද්ධිය උදෙසා රාජ්‍ය හා පෞද්ගලික යන දෙඅංශයම පාර්ශවකරුවන් වශයෙන් (PPP-Public Private Partnership) මධ්‍යම රජයේ

ප්‍රතිපත්තිවලට සමගාමීව පළාත තුළ සංවර්ධන ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම කෙරෙහි ඉදිරි වර්ෂයේ දී විශේෂ අවධානයක් යොමු කොට කටයුතු කිරීමට බලාපොරොත්තු වෙනවා. එසේම සංවර්ධන ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමේදී ප්‍රතිලාභී දායකත්වය ඉහළ නංවා ගැනීම, පළාතේ බදු ආදායම හා වෙනත් ආදායම් ඉහළ නංවා ගැනීම, රාජ්‍ය දේපළ, මානව සම්පත් මෙන්ම භෞතික සම්පත් වඩා කාර්යක්ෂමව හා ඵලදායී ලෙස යොදා ගනිමින් පළාත් සභාවේ වියදම් කළමනාකරණය කිරීම, ඌන උපයෝජිත වත්කම් හා උපයෝජනයට නොගත් වත්කම් ප්‍රයෝජනයට ගැනීම මෙන්ම පළාතේ නව සංවර්ධන විභවතාවයන් හඳුනා ගනිමින් කටයුතු කිරීමටත්, පළාත තුළ ඇති ස්වභාවික සම්පත් නිසි කළමනාකරණයක් යටතේ සැලසුම් කර ඒවායේ ප්‍රතිලාභ පළාතේ ජනතාවට අත්කර දීමටත් ඉදිරියේ දී අවධානය යොමු කළ යුතු වෙනවා.

කෘෂිකාර්මික වශයෙන් මධ්‍යම පළාත රටේ ජාතික ආදායමට විශාල දායකත්වයක් දැක්වූවත්, පළාතේ කෘෂිකාර්මික ජනතාවගේ ආදායම් මට්ටම තීරණය කිරීමේදී අතරමැදියන්ගේ බලපෑම තීරණාත්මක සාධකයක්ව පවතී. එබැවින් නිෂ්පාදකයා හා පාරිභෝගිකයා ආරක්ෂා කිරීමටත්, අතරමැදියන්ගේ බලපෑම් අවම කිරීමටත් නව ක්‍රමෝපායන් හඳුනාගත යුතුව ඇත. යටිතල පහසුකම් සංවර්ධනය අඩු ප්‍රදේශ කෙරෙහි විශේෂ අවධානයක් යොමු කරමින් නිෂ්පාදකයාට පාරිභෝගිකයන් සමග සෘජුවම ගනුදෙනු කිරීමට හැකි වන පසුබිමක් සකස් කළ යුතු වෙනවා. විශේෂයෙන්ම සති පොළ සංවර්ධන, කෘෂි ප්‍රවේශ මාර්ග සංවර්ධනය හා නඩත්තුව, ගොවීන් සංවිධානගත කිරීම යනාදිය කෙරෙහි විශේෂ අවධානයක් යොමු කළ යුතුව ඇත. නිෂ්පාදකයා සතු අතිරික්ත නිෂ්පාදනය අතරමැදියන් හරහා වෙළඳපලට නිකුත් කිරීම වෙනුවට නිෂ්පාදකයන් ඒකරාශී වීමෙන් ඇති කරගන්නා ආයතනික රාමුවක් හා තොරතුරු පද්ධතියක් හරහා සෘජුවම පාරිභෝගිකයන්ට අළෙවි කිරීමට හැකි වන පරිදි කෘෂි අළෙවි තොරතුරු ජාල පද්ධතියක් පිහිටුවීම කාලීන අවශ්‍යතාවක් වී ඇත. ලොව බොහෝ දියුණු රටවල විවිධ ක්ෂේත්‍රයන්ට අදාළව මෙවැනි තොරතුරු පද්ධතීන් ඇති කිරීම තුළින් නිෂ්පාදකයින්ට පාරිභෝගිකයන් සමග සෘජුව සම්බන්ධ වී ගනුදෙනු කිරීමට හැකි වී තිබෙනවා.

**ජාතික සමගිය හා සංහිඳියාව**

ගරු සභාපතිතුමනි,

දශක තුනකට ආසන්න කාලයක් පුරා අප රටේ ජන කොටස්වල සමගිය හා සහෝදරත්වය කඩාබිඳ දැමූ ඒ කුරිරු යුද්ධය නිමාවට පත්කර වසර ගණනාවක් ගතවුවත් ජනතා සිත්සතන් තුළ සමගිය හා සංහිඳියාව මුල්බැස ගන්වන්නට තවදුරටත් අපි කටයුතු කළ යුතුව තිබෙනවා.

අතිගරු ජනාධිපති මෛත්‍රීපාල සිරිසේන මැතිතුමාගේ උපදෙස් මත හිටපු ගරු ජනාධිපති චන්ද්‍රිකා බණ්ඩාරනායක කුමාරතුංග මැතිතුමියගේ සභාපතීත්වයෙන් යුතුව ස්ථාපිත කර තිබෙන ජාතික සමගි හා සංහිදියා කාර්යාලය මගින් මේ රටේ සියලු ජන කොටස්වලට තම තමන්ගේ ජාතික හා ආගමික අනන්‍යතාවයන් සුරකිමින් එකිනෙකාට ගරු කරමින් අභිමානවත් ශ්‍රී ලාංකික ජනතාවක් ලෙස ජීවත්වීමට අවශ්‍ය පරිසරය උදා කරමින් පවතිනවා. ජාතික සංහිදියාව අනාගත පරපුර තුළ ජනිත කරවන්නට මෙම වර්ෂයේ සියලුම ජාතික හා ආගමික උත්සව සියලු ජන කොටස් සමඟ ඒකාබද්ධව රට පුරා ක්‍රියාත්මක කිරීමේ වැඩපිළිවෙලක් දියත් වෙනවා. මේ යටතේ මධ්‍යම පළාතේ පසුගිය දිනවල තෛපොංගල් උත්සවය, සිංහල හින්දු, අලුත් අවුරුදු උත්සවය, ඉෆ්තාර් උත්සවය මෙන්ම අනෙකුත් ජාතික උත්සව සියලු ජාතින්ගේ නියෝජනයෙන් පැවැත්වීමට හැකි විය. 2017 වර්ෂයේ දී මෙම කාර්යයන් අඛණ්ඩව පවත්වා ගැනීමට අපේක්ෂා කරනවා.

**වතු ආශ්‍රිත ජනතාව**

අපේ පළාතේ ජීවත්වෙන ලක්ෂ පහක් පමණ වන වතු ප්‍රජාවගේ ජීවන තත්ත්වය නංවාලීම කෙරෙහි අපේ අවධානය යොමු කළ යුතු වෙනවා. ඔවුන්ගේ නිවාස, අධ්‍යාපනය, සෞඛ්‍යය හා පෝෂණ තත්ත්වය මෙන්ම රැකියා සුරක්ෂිතභාවය පිළිබඳවත් වතු ආශ්‍රිත භෞතික යටිතල පහසුකම් සංවර්ධනය පිළිබඳවත් පළාතක් විදිහට අවධානය යොමු කරන අතරම මධ්‍යම රජයේ අවධානය ඒ සඳහා යොමු කර ගනිමින් වතු ප්‍රජාවගේ ජීවන තත්ත්වය නංවාලීමට කටයුතු කළ යුතුව තිබෙනවා. මේ කෙරෙහි වර්තමාන යහපාලන රජය ප්‍රමුඛ අවධානය යොමු කර කටයුතු කරන බව කිව යුතුයි.

ඒ සඳහා පළාත් සභාවක් විදිහට අපේ සහයෝගය උපරිමයෙන් ලබාදිය යුතුයි.

බහුජාතික හා බහු ආගමික ප්‍රජාවක් සමගිය හා සංහිඳියාව තුළින් එකම මවකගේ දරුවන් සේ එක පවුලක් ලෙස එක් සිත්ව එක්සත්ව ජීවත් වීම තුළින් මධ්‍යම පළාතේ ජනතාව මෙරටට පමණක් නොව සමස්ත ලෝකයටම මනා ආදර්ශයක් සපයා දී තිබෙනවා. කුමන ආරවුල් කුමන මතභේද කුමන ගැටළුකාරි තත්ත්වයක් අතීතයේ දී රට තුළ නිර්මාණය වුවත් මධ්‍යම පළාතේ ජනතාව එකම ජාතියක් ලෙස සමගියෙන් හා සමාදානයෙන් එදා මෙදා තුර ජීවත්වීම ප්‍රශංසනිය කාර්යයක් බව කිව යුතුය.

**ආපදා කළමනාකරණය**

මෙම වර්ෂයේ පැවතුන අයහපත් කාලගුණික තත්ත්වයන් හමුවේ මධ්‍යම පළාතේ මෙන්ම සමස්ත රටපුරා ඇති වූ ආපදා තත්ත්වයට අපගේ පළාත් සභාව එකම කණ්ඩායමක් ලෙස එක්ව කටයුතු කිරීමට සූදානම් වීම කාලෝචිත අවශ්‍යතාවයක් සේ සළකනවා. සිංහල. දෙමල, මුස්ලිම් කුමන ජන කොටසක් වේවා ආපදාවට ලක්වන්නේ අපේම ශ්‍රී ලාංකික ජාතියේ සාමාජිකයන් බව අපි මතකයේ තබාගත යුතුයි. අද පවතින ආපදා තත්ත්වයන්ට මිනිස් ක්‍රියාකාරකම් සෘජුවම බලපා තිබෙන බව කනගාටුවෙන් වුවත් ප්‍රකාශ කළ යුතුයි. ආපදා අවදානම් සහිත පළාතක් ලෙස සැලකෙන මධ්‍යම පළාතේ ජනතාවගේ එදිනෙදා ක්‍රියාකාරකම් පරිසරයට හානි නොවන පරිදි පවත්වාගෙන යාමට අපි ඔවුන් දැනුවත් කළ යුතු වෙනවා.

මධ්‍යම පළාතේ කඳු බෑවුම් සහිත පිහිටීමත්, වර්ෂාව අධික දේශගුණයත්, අක්‍රමවත් ඉඩම් පරිහරණ රටාවත් නිසා ජල ගැලීම්, නායයෑම්, සුලි සුළං වැනි ස්වාභාවික ව්‍යාවසනයන්ට ගොදුරුවන්නට තිබෙන ඉඩකඩ බොහෝයි. කෙසේ වෙතත් ආපදාවක් වීමට පෙර එම තත්ත්වයෙන් මධ්‍යම පළාතේ ප්‍රජාව බේරා ගැනීමට අවශ්‍යවන ක්‍රමවේදයක් හඳුනාගෙන ආපදා කළමනාකරණ වැඩසටහනක් පළාත පුරා ක්‍රියාවට නැංවීමට අප වහ වහා කටයුතු කළ යුතු වෙනවා. මේ සඳහා ඔබ සැමදෙනාගේ සහයෝගය දායකත්වය, හා කැපවීම අවශ්‍ය වෙනවා. පළාතේ සියලුම ආයතන මේ හා බද්ධ වී කටයුතු කළ යුතුයි.

**පළාත් රාජ්‍ය සේවාව**

ගරු සභාපතිතුමනි,

අද පළාතේ රාජ්‍ය සේවයට අවශ්‍ය තරම් භෞතික සම්පත් ලැබී තිබෙනවා. ඉතා අලංකාර කාර්යාල ගොඩනැගිලි, ලී බඩු උපකරණ හා තාක්ෂණික උපකරණවලින් මධ්‍යම පළාතේ කාර්යාල විශාල ප්‍රමාණයක් අද අංග සම්පූර්ණ වී තිබෙනවා කියා මා සිතනවා. තවදුරටත් වැඩිදියුණු විය යුතු කාර්යාල එම අවශ්‍යතා ඉදිරියේදී සපුරා ගැනීමට කටයුතු කළ යුතුය. මධ්‍යම පළාතේ අමාත්‍යාංශ/දෙපාර්තමේන්තු හා ආයතනවල මානව සම්පත් අවශ්‍යතාවය සෑහෙනදුරට සම්පූර්ණවෙලයි තිබෙන්නේ. ආයතන කිහිපයක මානව සම්පත් අවශ්‍යතාවල අඩු පාඩු පවතිනවා. ඒවා නොපමාව සම්පූර්ණ කරන්නට අවශ්‍ය කටයුතු කළයුතු වෙනවා. පළාතේ සෑම කාර්යාලයක්ම වර්තමානයට ගැලපෙන අයුරින් ඵලදායි හා කාර්යක්ෂම සේවාවක් සපයන මහජන හිතකාමී කාර්යාල බවට පත්වී තිබෙනවා.

2016 වර්ෂයේ මධ්‍යම පළාත් සභාවේ ප්‍රාග්ධන ආයෝජනය රු.මි. 5174 ක් වූ අතර පුනරාවර්තන වියදම රු.මි. 29,418 ක් විය. මෙය අනුපාතිකව බැලූ විට 1:5.7 ක් පමණ වෙනවා. මෙයින් කියවෙන්නේ පළාතේ සංවර්ධනය වෙනුවෙන් 2016 වර්ෂයේදී වියදම් කළ එක් රුපියලක් වෙනුවෙන් පළාතේ රාජ්‍ය සේවය සඳහා එනම්, පඩිනඩි ගෙවීම් ඇතුළු අනෙකුත් පුනරාවර්තන වියදම් සඳහා රු. 5.70 ක් වැය කිරීමට සිදුව ඇති බවයි. 2017 වර්ෂය පිළිබඳව සලකා බැලීමේදී මෙය 1:13.47 ක් ලෙස ඉහළ ගොස් තිබෙනවා. එනම් පළාතේ සංවර්ධනය වෙනුවෙන් 2017 වර්ෂයේ දී වියදම් කරන එක් රුපියලක් වෙනුවෙන් පළාත් රාජ්‍ය සේවයේ පඩිනඩි ඇතුළු අනෙකුත් අතිරේක වියදම් සඳහා රු.13.47 ක් වියදම් කිරීමට සිදුවෙනවා. මෙයට ප්‍රධාන වශයෙන් හේතු වන්නේ 2017 වර්ෂය සඳහා ප්‍රාග්ධන වියදම් ලෙස වෙන් කළ ප්‍රතිපාදන රු.මි. 2,222ක් වශයෙන්, 2016 වර්ෂයට සාපේක්ෂව රු.මි. 2,951කින් පහළ ගොස් තිබීමයි.

රාජ්‍ය භාණ්ඩාගාරය මගින් ප්‍රාග්ධන වියදම් සඳහා වෙන් වන ප්‍රතිපාදන මෙලෙස විශාල ලෙස අඩුවූවත්, මධ්‍යම පළාතේ සංවර්ධනය වෙනුවෙන් මහා

භාණ්ඩාගාරයෙන් පළාත් සභාවට වෙන් කෙරෙන මුදලට අමතරව රේඛීය අමාත්‍යංශ, රාජ්‍ය නොවන සංවිධාන සහ පෞද්ගලික අංශයේ අරමුදල් ලබාගනිමින් පළාත් සභාවේ දේශපාලන අධිකාරිය ලෙස ඔබ අප සෑම දෙනාත් සංවර්ධන හා පරිපාලනමය කටයුතු ඉටු කරන පළාත් රාජ්‍ය සේවයේ නිලධාරීන් සියලුදෙනාත් සුවිශාල කාර්යභාරයක් පළාතේ ප්‍රජාවගේ ජීවන තත්ත්වය නගාසිටුවීම සඳහා ඉටු කරන බව කිව යුතුයි.

**ජාතික වැඩසටහන් සමඟ බද්ධවීම**

පළාත් සභාවක් වශයෙන් පළාතේ ජනතාවගේ ජීවන තත්ත්වය නංවාලීමේ ප්‍රමුඛ පරමාර්ථයෙන් කටයුතු කිරීමේදී මධ්‍යම රජය විසින් ජාතික වශයෙන් ක්‍රියාත්මක කරන සංවර්ධන වැඩසටහන් සමඟ බද්ධ වී කටයුතු කරන්නට සිදුවෙනවා. එවැනි අවස්ථාවලදී අපේ පළාතට ජාතික වශයෙන් රේඛීය අමාත්‍යාංශ, දෙපාර්තමේන්තු හා ආයතන මගින් ලැබෙන දායකත්වය අගය කළ යුතුයි.

වර්තමාන යහපාලන රජයේ අතිගරු ජනාධිපතිතුමාගේ මඟ පෙන්වීම යටතේ ක්‍රියාත්මක වන ජාතික ආහාර වැඩසටහන, ජාතික පරිසර සංරක්ෂණ වැඩසටහන, ජාතික මත්ද්‍රව්‍ය නිවාරණ වැඩසටහන සහ ජාතික වකුගඩු රෝග නිවාරණ වැඩසටහන මධ්‍යම පළාත් ප්‍රජාවගේ යහපැවැත්මට විශාල පිටිවහලක් ලබාදෙමින් අදවනවිට ක්‍රියාත්මක වෙමින් පවතිනවා. 2017 වර්ෂයේ දී ද මෙම වැඩසටහන සක්‍රීයව ක්‍රියාත්මක කිරීමට කටයුතු කළ යුතු වෙනවා.

මෙවර අයවැය තුළින් අප විශේෂ අවධානයක් යොමු කළ යුතු කරුණක් තිබෙනවා. එනම් ගරු පළාත් සභා මන්ත්‍රී විමධ්‍යගත ප්‍රතිපාදන යොදා ක්‍රියාත්මක කෙරෙන ව්‍යාපෘති අතරින් විශාල ප්‍රමාණයක් ක්‍රියාත්මක කිරීම සඳහා මෙතෙක් කල් යොමු කරනු ලැබුවේ පළාත් සභාවේ පාලනය යටතට නොගැනෙන ආයතන වෙතටයි., එබැවින් ගරු මන්ත්‍රී විමධ්‍යගත ප්‍රතිපාදන යොදා ක්‍රියාත්මක කෙරෙන බොහෝ ව්‍යාපෘති මධ්‍යම පළාත් සභාවට අයත් ආයතන හරහා ක්‍රියාත්මක කිරීම සුදුසු බව අපගේ හැඟීමයි. උදාහරණ ලෙස ඉදිකිරීම් කටයුතු, ජීවනෝපාය සංවර්ධන ව්‍යාපෘති, වෘත්තීය පුහුණුව, සහ දැනුවත් කිරීමේ වැඩසටහන් ආදිය ඒ ඒ විෂය පථයට අනුව පළාත්

අමාත්‍යංශ යටතේ ඇති ආයතන හරහා ක්‍රියාත්මක කිරීමට පියවර ගත යුතුයි.

අප හමුවේ ඇති තවත් අභියෝගයක් වන්නේ තරුණ තරුණියන්ගේ රැකියා වියුක්තිය අවම කිරීම සඳහා අවශ්‍ය කෙටි කාලීන හා දිගුකාලීන විසඳුම් සොයා ගැනීමයි. මේ සඳහා පෞද්ගලික අංශය තුළ රැකියා අවස්ථා ප්‍රවර්ධනය සඳහා කටයුතු කළ යුතුයි. ඒ අනුව පෞද්ගලික අංශය සමඟ ගිවිසුම්ගත වෙමින් පෞද්ගලික අංශයේ වර්ධනයට සහයවීම තුළින් රැකියා අවස්ථා වැඩිකරවීමට අපේක්ෂා කරනවා. එමෙන්ම පක්ෂ විපක්ෂ සියල්ලන්ගේ එකඟතාවය හා දායකත්වයෙන් මධ්‍ය හා මහා පරිමාණ ඒකාබද්ධ ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම තුළින් නව රැකියා අවස්ථා ජනනය කිරීමට අවස්ථාව උදා කරගත යුතුව තිබෙනවා.

රාජ්‍ය වියදම් කළමනාකරණයේ දී උත්සව, ප්‍රදර්ශන වැනි කටයුතු සීමා කිරීමටත් අත්‍යාවශ්‍ය ව්‍යාපෘති පමණක් ක්‍රියාත්මක කිරීම සඳහා ප්‍රතිපාදන යෙදවීමටත් කටයුතු කළ යුතු වෙනවා.

ගරු සභාපතිතුමනි,

මම මෙතැන් සිට අප පළාත් සභාවේ 2017 වර්ෂය සඳහා මුදල් කොමිෂන් සභාව හරහා මහා භාණ්ඩාගාරයෙන් ලබා ගැනීමට නියමිත ප්‍රදානයන් හා එම ප්‍රදානයන් බෙදා දීමට නියමිත ආකාරය දැක්වීමට සූදානම් වෙමි.

| **ආදායම් හා ප්‍රදානයන් පුරෝකථනය** | **රු.මිලියන** |
| --- | ---: |
| සාමූහික ප්‍රදාන | 22,489.338 |
| රජය මගින් ලබාදෙන ආදායම | 4,140.000 |
| පළාත් ආදායම් ඉලක්කය (මුද්දර ගාස්තු හා උසාවි දඩ හැර) | 1,629.000 |
| පළාත් පාලන ආයතන වෙත මාරු කළ යුතු ආදායම | |
| මුද්දර ගාස්තු | 1,600.000 |
| උසාවි දඩ | 85.000 |
| පළාත් නිශ්චිත සංවර්ධන ප්‍රදාන | 1,168.930 |
| උපමාන පාදක ප්‍රදාන | 388.800 |
| විදේශාධාර | 665.000 |
| **එකතුව** | **32,166.068** |

**වියදම් පුරෝකථනය**

| | **රු. මිලියන** |
| --- | ---: |
| ප්‍රාග්ධන වියදම් | 2,222.730 |
| පුනරාවර්තන වියදම් | 29,943.338 |
| | **32,166.068** |

පුනරාවර්තන වියදම් පහත සඳහන් පරිදි වෙන් කෙරෙනු ඇත.

| | **රු. මිලියන** |
| --- | ---: |
| ආණ්ඩුකාරවර හා කාර්ය මණ්ඩලය | 15.884 |
| සභා ලේකම් කාර්යාලය | 119.180 |
| ප්‍රධාන අමාත්‍ය හා කාර්ය මණ්ඩලය | 29.545 |
| පළාත් පාලන දෙපාර්තමේන්තුව | 2,148.000 |
| සෞඛ්‍ය අමාත්‍ය හා කාර්ය මණ්ඩලය | 13.300 |
| මාර්ග අමාත්‍ය හා කාර්ය මණ්ඩලය | 13.156 |
| කර්මාන්ත අමාත්‍ය හා කාර්ය මණ්ඩලය | 14.876 |
| කෘෂිකර්ම අමාත්‍ය හා කාර්ය මණ්ඩලය | 14.675 |
| පළාත් රාජ්‍ය සේවයේ කාර්ය මණ්ඩලයේ වැටුප් හා අනෙකුත් වියදම් | 27,574.722 |
| **එකතුව** | **29,943.338** |

මෙම ප්‍රාග්ධන වියදම් තුළ විදේශාධාර වශයෙන් රු.මි. 665ක් ලැබෙන අතර, එම මුදල එම ව්‍යාපෘති සඳහාම වැය කළ යුතුයි. ඉතිරි මුදල වන රු.මි. 1557.73ක මුදල පළාතේ සංවර්ධන කටයුතු සඳහා ඒ ඒ විෂයයන් සඳහා අදාළ අමාත්‍යාංශ වෙත ලබාදීමට නියමිතය.

ගරු සභාපතිතුමනි,

ප්‍රාග්ධන වියදම් වශයෙන් ලැබෙන මුදල 2016 වර්ෂයට වඩා රු.මි. 2951.61කින් අඩු කර ඇත. ඒ අනුව 2017 වර්ෂය සඳහා ප්‍රාග්ධන වියදම් වශයෙන් අප පළාත් සභාවට ලැබෙන මුදල රු.මිලියන 2,222.73ක් වෙනවා. එම මුදල එක් එක් විෂය ක්ෂේත්‍රයේ බර තැබීම් අනුව මුදල් කොමිෂන් සභාව විසින් වෙන් කර දී තිබෙන අනුපාත ද සැළකිල්ලට ගෙන දැඩි වෙහෙසක් දරා පහත සඳහන් පරිදි ඒ ඒ අංශ සඳහා වෙන් කර දීමට අපේක්ෂා කරමි.

**අධ්‍යාපන සංවර්ධනය**

ගරු සභාපතිතුමනි,

සිසු පරපුර උදෙසා ඉහළ ගුණාත්මක තත්වයෙන් යුතු සම සාධාරණ අධ්‍යාපන අවස්ථා සලසා දීම පිණිස මැදරට අධ්‍යාපන පද්ධතිය සවිබල ගැන්වීමෙහිලා මෙහෙවරක යෙදෙමින්, මධ්‍යම පළාතේ පාසල් 1,574ක් (ජාතික පාසල් 54ක්ද ඇතුළත්ව) තුළ ගුරුවරුන් 31,302 මගින් පාසල් සිසුන් 531,063කගේ පමණ නැණ ගුණ වර්ධනය සඳහා 2016 වර්ෂයේ දී අධ්‍යාපන ක්ෂේත්‍රයේ මානව හා භෞතික සම්පත් සංවර්ධනය උදෙසා දැක් වූ පරිශ්‍රමය අතිමහත්ය. එහි දී ඒකාබද්ධ අරමුදල යටතේ රු.මි. 1000.00 ක් ද, ලෝක බැංකු ආධාර යටතේ රු.මි. 430.00 ක් ද,''නැණෝදා'' වැඩසටන යටතේ රු.මි. 250.00 ක් ද, යුනිසෙෆ් ආධාර යටතේ රු.මි. 24.04 ක් ද වශයෙන් රු.මි. 1704.04 ක් ආයෝජනය කරන ලදි. මීට අමතරව රේඛීය අමාත්‍යංශය මගින් ක්‍රියාත්මක කරන "ළඟම පාසල හොඳම පාසල" වැඩසටහන යටතේ රු.මි. 6,605ක් ලැබීම පළාතේ අධ්‍යාපන සංවර්ධනයට ඉමහත් රුකුලක් වනු ඇත.

මෙම මුදල් ආයෝජනය කරමින් පළාත් අධ්‍යාපන සංවර්ධනය වෙනුවෙන් 2016 වර්ෂයේදී ගොඩනැගිලි ඉදි කිරීම් ව්‍යාපෘති 137ක්, ජල අවශ්‍යතා ව්‍යාපෘති 270ක්, සනීපාරක්ෂක අවශ්‍යතා ව්‍යාපෘති 211ක්, පාසල් හැර යන දරුවන් සඳහා වන වෘත්තීය පුහුණු වැඩසටහන් 18ක්, පාසල් නවීකරණ කටයුතු 73ක්,  ගුරු නිවාස ඉදි කිරීම හා අලුත්වැඩියාවන් 127ක් සහ වෙනත් ව්‍යාපෘති රැසක් ක්‍රියාත්මක කළ බව සඳහන් කරන්නට කැමැත්තෙමි.

භෞතික යටිතල පහසුකම් සංවර්ධනය යටතේ ගොඩනැගිලි ඉදිකිරීම හා නවීකරණය, විදුලි, ජල හා සනීපාරක්ෂක අවශ්‍යතා සපුරාලීම, ගුරු නිවාස ඉදිකිරීම, දන්ත ශල්‍යාගාර අලුත්වැඩියාව හා නවීකරණය කිරීම, ලී බඩු හා උපකරණ ආදී භෞතික සම්පත් වැඩිදියුණු කිරීමද, මානව සම්පත් සංවර්ධනයේ දී වෘත්තීය පුහුණු හා නිපුණතා සංවර්ධන වැඩසටහන් ක්‍රියාත්මක කිරීම, අධ්‍යාපනයේ ගුණාත්මක සංවර්ධනය සඳහා වැඩමුළු පැවැත්වීම, ජාතික මට්ටමේ විභාගවල ප්‍රතිඵල ඉහළ නැංවීමේ වැඩසටහන් ක්‍රියාත්මක කිරීම හා ජාත්‍යන්තර මට්ටමේ තරග සඳහා සහභාගී වන සිසුන්හට ශිෂ්‍යත්ව ලබාදීම වැනි වැඩසටහන් ක්‍රියාත්මක කරන ලදී.

සැමට සම අධ්‍යාපන අවස්ථාවක් ලබාදීම සහතික කරනු පිණිස දුෂ්කර ප්‍රදේශවල ගුරු පුරප්පාඩු පිරවීම සඳහා 2016 වර්ෂයේ දී උපාධිධාරී හා ඩිප්ලෝමාධාරීන් 1429ක් බඳවා ගන්නා ලදී. එම පිරිස විද්‍යා, ගණිත, ඉංග්‍රීසි ගුරුවරු 545ක්, ශික්ෂණ විද්‍යා/ඩිප්ලෝමාධාරීන් 375ක්, ප්‍රාථමික ගුරුවරු 476ක් සහ තාක්ෂණික උපාධිධාරීන්/ඩිප්ලෝමාධාරීන් 33කගෙන් සමන්විත විය. මීට අමතරව වතු ආශ්‍රිත ප්‍රදේශවල අධ්‍යාපනය නගාසිටුවීම උදෙසා ගුරු සහයකයින් 269 දෙනෙකු බඳවා ගන්නා ලදී.

මධ්‍යම පළාතේ අධ්‍යාපනයේ ගුණාත්මක සංවර්ධනය පිළිබඳ සමස්තයක් වශයෙන් සළකා බැලිය යුතු වෙනවා. පළාතේ විභාග ප්‍රතිඵල පිළිබඳ සැලකීමේ දී අපි අපේක්ෂා කළ අයුරින් දුෂ්කර කලාපයන්හී ප්‍රගතියක් පෙන්නුම් කිරීම සතුටට කරුණකි. විශේෂයෙන්ම විල්ගමුව, වලපනේ වැනි කලාප අ:පො:ස (සා.පෙළ) විභාගයේ ප්‍රතිඵල වර්ධනයක් අත් කරගෙන ඇත. 2015 වර්ෂයේ දී අපොස (සා.පෙළ) ප්‍රතිඵල අනුව මහනුවර කලාපය දිවයිනේ කලාප 98 අතරින් ප්‍රථම ස්ථානයට පත් වී ඇත. එමෙන්ම 2015 වර්ෂයේ අපොස (සා.පෙළ) ප්‍රතිඵල අනුව දිවයිනේ හොඳම පාසල් අතරින්

54 වන ස්ථානය මහනුවර ස්වර්ණමාලී බාලිකා විද්‍යාලය ලබා ගෙන ඇත. 2014 වර්ෂය හා සංසන්දනය කිරීමේ දී 2015 වර්ෂයේ දී දිවයිනේ කලාප 98 න් අපොස (සා.පෙළ) ප්‍රතිඵල අනුව තෙල්දෙණිය අධ්‍යාපන කලාපය 7.76 % ක ප්‍රතිඵල වර්ධනය කර ගනිමින් දිවයිනේ වැඩිම වර්ධනයක් අත් කරගත් කලාපය බවට පත් වී ඇත. 2015 අපො.ස (සා.පෙළ) විභාගය මධ්‍යම පළාතේ සිසුන් 670 ක් විශිෂ්ට සාමාර්ථ 09 ක් ලබා ගත් අතර දුෂ්කර කලාපයක් වන විල්ගමුව කලාපයෙන් ප්‍රථම වරට විශිෂ්ට සාමාර්ථ 09 ක් බිහි වීම පළාතේ අධ්‍යාපනයේ සමබර සංවර්ධනයට කදිම නිදසුනකි. එමෙන්ම අවධාරණය කළ යුතු කාරණයක් තිබෙනවා. දෙමව්පියන් අතර තරගකාරි විභාගයක් බවටත්, දරුවන්ට ඉමහත් පීඩාවක් බවටත් පත්ව ඇති 5 වසර ශිෂ්‍යත්ව විභාගය පළාතේ අනෙකුත් උසස් විභාගවල ප්‍රතිඵල සමග සැසඳීමේ දී තීරණාත්මක සාධකයක් ලෙස බලපා නොමැති බව කිව යුතුයි. එසේම පළාතේ සියලුම පාසල් එකසේ 5 වසර ශිෂ්‍යත්ව විභාගය සමත් කරවීම උදෙසා උනන්දුවක් නොදක්වන බව ද කිව යුතුය.

රේඛීය අමාත්‍යංශය මගින් ක්‍රියාත්මක කරන ''ළඟම පාසල හොඳම පාසල'' වැඩසටහන යටතේ මධ්‍යම පළාතේ ජාතික පාසල් 47 ක් හා පළාත් සභා පාසල් 901 ක් ඇතුළුව පාසල් 948 ක සංවර්ධන ව්‍යාපෘති ක්‍රියාත්මක වීම අපට ලොකු ශක්තියක් බව කිව යුතුමය. මේ යටතේ ව්‍යාපෘති 2,996 ක් ක්‍රියාත්මක වන අතර ඒ සඳහා රු.මි. 6,605 ක් වෙන් කර තිබේ.

පළාතේ මෙන්ම රටේ අනාගතයේද තීරණාත්මක සාධකයක් වන අධ්‍යාපන අංශයේ සංවර්ධනය වෙනුවෙන් ඉදිරි වර්ෂයේදී ද රේඛීය අමාත්‍යංශයේ දායකත්වය අපේක්ෂා කරන අතර, පළාත් සභාවේ අයවැය තුළින් රු.මි. 240.0 ක් වෙන් කිරීමට යෝජනා කරමි.

**ඉඩම් සංවර්ධනය**

ගරු සභාපතිතුමනි,

මධ්‍යම පළාත තුළ පිහිටි රජයේ ඉඩම් හා ඊට අනුබද්ධ සම්පත්වල භාරකාරීත්වය දරමින් ඒවා ජනතාවගේ අභිවෘද්ධිය පිණිස භාවිතයට ගැනීමේදී ආර්ථික, සමාජීය හා පාරිසරික සාධක සමතුලිත කරන මනා

කළමණාකාරීත්වයක් පවත්වා ගැනීම කළ යුතු වෙනවා. ඉඩම් හිඟය හා පාරිසරික හේතූන්වලට අවධානය යොමු කරමින් ඉඩම් නොමැති ජනතාවට ඉඩම් බෙදා දීමට අවශ්‍ය කටයුතු කිරීම ප්‍රධාන කාර්යයක් ලෙස ඉටු කෙරෙනවා. එසේම තෝරාගත් ජනදවල යටිතල පහසුකම් සංවර්ධනය, ජනපද ඉඩම් සංවර්ධනය, ඉඩම් අත්පත් කර ගැනීම ආදී කාර්යයන් ක්‍රියාත්මක වෙනවා. තවද ජනපද මාර්ග සංවර්ධනය, පාංශු සංරක්ෂණය සහ ආර්ථික භෝග වගා කිරීම ප්‍රචලිත කිරීම යනාදිය ද සිදු කරනු ලබනවා. අවශ්‍යතාවය අනුව ඉඩම් අත්පත් කර ගැනීම හා රාජ්‍ය ආයතන සතු ඉඩම් මැන නිරවුල් කිරීමද අත්‍යවශ්‍ය කරුණක් බව කිව යුතුයි. එමෙන්ම පළාතට ආදායම් උපයා දෙමින් ඉඩම් බදු ආදායම ලෙස  රු.මි. 56 කට ආසන්න මුදලක් 2016 වර්ෂයේ තුන්වන කාර්තුවේ දී රැස් කිරීමට හැකිවිය. මේ අනුව මෙකී කාර්යයන් අඛණ්ඩව වැඩිදියුණු කරමින් පවත්වාගෙන යාම උදෙසා 2017 වර්ෂයට රු.මි. 6.0 ක් වෙන්කර දීමට යෝජනා කරමි.

**පළාත් පාලනය**

මැදරට ප්‍රජාවගේ සුබ සිද්ධිය සඳහා පළාත් පාලන ආයතනවලට පැවරී ඇති කාර්යය හා කර්තව්‍ය කාර්යක්ෂමව හා ඵලදායී ලෙස ඉටු කිරීමට හැකි වන පරිදි මිත්‍රශීලී මග පෙන්වීම, පහසුකම් සලස්වා දීම හා සහාය දීම තුලින් යහපාලනයෙන් යුතු සාර්ථක පළාත් පාලන ආයතන පද්ධතියක් මධ්‍යම පළාත තුළ ස්ථාපිත කිරීම උදෙසා 2016  වර්ෂයේ ඉටු කළ කාර්යභාරය අතිමහත්ය. 2016 වර්ෂයේ පළාත් පාලනය වෙනුවෙන් වෙන්කළ මුදල් ප්‍රමාණය රු.මි. 246 කි. මේ යටතේ මෙම වර්ෂය තුළදී පළාත් මාර්ග වැඩසටහන යටතේ ව්‍යාපෘති 211 ක් ක්‍රියාත්මක කිරීම  සහ ඝන අපද්‍රව්‍ය කළමනාකරණ වැඩසටහන යටතේ කසල ප්‍රවාහනය සඳහා කම්පැක්ටර් ලබාදීම, ප්‍රතිචක්‍රීයකරණ ද්‍රව්‍ය  එකතු කිරීමේ මධ්‍යස්ථාන ස්ථාපිත කිරීම, කොම්පෝස්ට අංගන ඉදි කිරීම හා අලුත්වැඩියාව, ගෘහස්ථ කොම්පෝස්ට් බඳුන් ලබා දීම, දැනුවත් කිරීමේ වැඩසටහන් පැවැත්වීම හා දැනුවත් කිරීමේ පුවරු සැකසීම ක්‍රියාත්මක වේ. මීට අමතරව පොදු වෙළඳපල අලුත්වැඩියාව හා  විධිමත් කිරීම, සතිපොළ අලුත්වැඩියාව හා විධිමත් කිරීම, ආදාහනාගාර හා මිහිදන් උයන් අලුත්වැඩියාව හා විධිමත් කිරීම, ආයුර්වේද බෙහෙත් ශාලාවල අත්‍යාවශ්‍ය නඩත්තු කිරීම් හා අලුත්වැඩියාව, පොදු වැසිකිළි

අලුත්වැඩියාව හා නඩත්තු කිරීම, පෙර පාසල් හා ළමා උද්‍යානයන්හි යටිතල පහසුකම් සංවර්ධනය ක්‍රියාත්මක වේ. මහවැලියෙන් පවරාගත් වත්කම් නඩත්තු වැඩසටහන යටතේ ව්‍යාපෘති 51ක් ක්‍රියාත්මක වේ. තව ද ග්‍රාමීය ප්‍රජා ජල ව්‍යාපෘති සංවර්ධනය සඳහා රු.මි. 50ක් වැය කරනු ලබන අතර එහි දී අක්‍රිය ජල ව්‍යාපෘති නැවත ක්‍රියාත්මක කිරීම, පවතින ජල ව්‍යාපෘති සංවර්ධනය, පරිසර සංරක්ෂණ වැඩසටහන් ක්‍රියාත්මක කිරීම හා රාජ්‍ය නිලධාරීන් හා ප්‍රජා මූල සංවිධානයන්හී නිලධාරීන් සඳහා පුහුණු වැඩසටහන් ක්‍රියාත්මක කිරීම සිදු කරනු ලබයි.

මධ්‍යම රජයේ ප්‍රතිපාදන යටතේ ප්‍රාදේශීය සභා ශක්තිමත් කිරීමේ ජාතික වැඩසටහන තුළින් මධ්‍යම පළාත තුළ ව්‍යාපෘති 245 ක් ක්‍රියාත්මක වන අතර ඒ සඳහා මේ වන විට රු. මි. 87 ක් ලැබී ඇත. මේ තුළින් පළාත් පාලන ආයතනවල අත්‍යාවශ්‍ය ප්‍රජා යටිතල පහසුකම් වැඩි දියුණු කිරීම සඳහා අවශ්‍ය සහාය ලබා දීම සහ ඒ මගින් ජනතාවට ලබා දෙන සේවවාන්හි ගුණාත්මකභාවය වර්ධනය හා ඵලදායීතාවය ඉහළ නැංවීම අරමුණ වේ. මේ යටතේ එක් ප්‍රාදේශීය සභාවකට රු.මි. 6.0 බැගින් ලබා දේ. තවද පළාත් පාලන ආයතනවල යටිතල පහසුකම් සංවර්ධනය සඳහා ප්‍රාග්ධන වැඩසටහන යටතේ මධ්‍යම පළාතට මේ වනවිට රු.මි. 155ක මුදලක් ලැබී ඇත. නාගරීකරණය සමග ඉහළ යන මහජන අවශ්‍යතාවලට සරිලන පරිදි පහසුකම් සපයා දීමට නිසි වැඩපිළිවෙලක් සකස් කිරීම උදෙසා පළාත් පාලන ආයතන බල ප්‍රදේශවල කාණු පද්ධති, අතුරු පාරවල්, දින පොළ හා සතිපොළ පොදු පහසුකම්, ජල ව්‍යාපෘති වැනි අත්‍යාවශ්‍ය ප්‍රජා යටිතල පහසුකම් අලුතින් ඉදි කිරීම සඳහා අවශ්‍ය සහය ලබා දීම කරනු ලැබේ. මේ සඳහා එක් පළාත් පාලන ආයතනයකට රු.මි. 40 ක් ලබා දෙන අතර පළාත් පාලන ආයතන 43 ක් තුළ මෙය ක්‍රියාත්මක වේ. තව ද ආසියානු සංවර්ධන බැංකු ආධාර යටතේ ''පුර නැගුම'' වැඩසටහන මෙම වසරේදීත් පළාත් පාලන ආයතන 23 ක ව්‍යාපෘති 41 ක් සඳහා රු.මි. 1185 ක් වැයකරමින් ක්‍රියාත්මක වේ. පළාත් පාලන කටයුතු පවත්වාගෙන යමින් පළාතේ ජනතාවගේ එදිනෙදා කටයුතු පහසු කරනුවස් මධ්‍යම රජයේ ප්‍රතිපාදන ඉහතින් දැකුවූ පරිදිම ඉදිරි වර්ෂයටත් අපේක්ෂා කරන අතර, පළාත් සභා අයවැයෙන් 2017 වර්ෂය සඳහා රු.මි. 71.0ක් වෙන් කරදීමට යෝජනා කරමි.

## පූර්ව ළමාවිය සංවර්ධනය

පූර්ව ළමාවිය අවධියේ පසුවන දරුවන්ගේ අයිතීන් සුරක්ෂිත කිරීමත්, කායික හා මානසික වශයෙන් දරුවා ශක්තිමත් කිරීමත්, ඒ සඳහා මුල් ළමාවිය සංවර්ධන මධ්‍යස්ථාන පිළිගත් ප්‍රමිතීන් යටතේ පවත්වාගෙන යාම සඳහා වන ක්‍රමවේදයන් සකස් කර ඇත. ඒවා ක්‍රියාත්මක කිරීම හා නියාමනය කිරීම සහ අධික්ෂණය කිරීම  තුළින්  නිසියාකාරයෙන් දරුවන්ගේ මුල් ළමාවිය ප්‍රමිතිගත අයුරින් සංවර්ධනය  කර විධිමත් පාසල් අධ්‍යාපනය සඳහා මනාව සුදානම් වු දරු පරපුරක් මැදරටින් බිහි කිරීම අපගේ ප්‍රධාන අරමුණයි. මේ සඳහා පූර්ව ළමාවිය සංවර්ධන ඒකකය මගින් මූලික කටයුතු 2016 වර්ෂය තුළ ආරම්භ කර ඇත. සමීක්ෂණ වාර්තාවන්ට අනුව මේ වනවිට මධ්‍යම පළාත තුළ මුල් ළමාවිය සංවර්ධන මධ්‍යස්ථාන 2425 ක් පවතී. 2016 වර්ෂය තුළ උපමාන පාදක සංවර්ධන ප්‍රදාන යටතේ රු.මි. 5.0 ක් ද, යුනිසෙෆ් වැඩසටහන යටතේ රු.මි. 4.2 ක් ද ආයෝජනය කරමින් ප්‍රධාන ව්‍යාපෘති 14 ක් ක්‍රියාත්මක කරන ලදි. මෙම කටයුතු ප්‍රවර්ධනය කරමින් පවත්වාගෙන යාම සඳහා 2017 වර්ෂයට රු.මි. 3.0 ක් වෙන්කර දීමට යෝජනා කරමි.

## සංස්කෘතික කටයුතු සංවර්ධනය

සංස්කෘතික, කලා හා ඓතිහාසික උරුමයන් සුරකින මතු පරපුරක් බිහි කිරීමෙහි ලා මෙම වසරේ දී මධ්‍යම පළාත තුළ වැඩසටහන් රාශියක් ක්‍රියාත්මක වේ. සංස්කෘතික හා ආගමික උත්සව සඳහා විශේෂ දායකත්වයක් ලබා දෙමින් ක්‍රියාත්මක වන මෙම වැඩසටහන් සඳහා 2016 වර්ෂයේ දී වෙන් වී ඇති ප්‍රතිපාදන රු.මි. 8.0 කි. මේ යටතේ ජන කලාවන් සංරක්ෂණය, ජනශ්‍රැති ග්‍රන්ථකරණය, සාරථී සාර සංග්‍රහය, ලේඛක අත්වැල හා දරුවන්ගේ  කියවීමේ හැකියාව වර්ධනය කිරීම උදෙසා වැඩසටහන් යනාදිය ක්‍රියාත්මක විය. තවද කලායතන සංවර්ධනය හා කලායතනාධිපති පුහුණුව, මධ්‍යම පළාත් රාජ්‍ය නැටුම් කණ්ඩායම ප්‍රවර්ධනය කිරීම, රසවින්දන හා සාරධර්ම ප්‍රවර්ධන වැඩසටහන් ක්‍රියාත්මක කිරීම, දහම් පාසල් සිසු කුසලතා වැඩසටහන් ක්‍රියාත්මක කිරීම යනදිය සිදු කෙරිණි. තවද වෙනත් ආගම් සඳහා ද ප්‍රමුඛතාවක් දෙමින් හින්දු හා මුස්ලිම් සංස්කෘතික වැඩසටහන් ද ක්‍රියාත්මක විය. එමෙන්ම වාර්ෂිකව මධ්‍යම පළාතේ සියලු

කලාකරුවන්ගේ දක්ෂතා ඇගයීම උදෙසා මධ්‍යම පළාත් කලා උළෙල, කෙටි නාට්‍ය හා කෙටි චිත්‍රපට, ළමා නාට්‍ය උළෙල හා චිත්‍ර තරග මෙන්ම ජ්‍යෙෂ්ඨ කලාකරුවන් ඇගයීම ද සිදු කරනු ලබනවා. මෙම කාර්යයන් අඛණ්ඩව අපේක්ෂිත අරමුණු ඉටු කරගනිමින් ක්‍රියාත්මක කිරීම උදෙසා 2017 වර්ෂයට රු.මි. 8.0 ක් වෙන් කරදීමට යෝජනා කරමි.

**සංචාරක ප්‍රවර්ධනය**

පාරිසරික, සංස්කෘතික හා සංචාරක කර්මාන්තය අතින් වැදගත්කමක් ඇති ආකර්ෂණීය ස්ථාන හඳුනාගෙන ඒවා සඳහා යටිතල පහසුකම් සංවර්ධනය කිරීම මගින් දෙස් විදෙස් සංචාරකයින් සඳහා වඩාත් ප්‍රියමනාප පහසුකම් සැපයීමත්, එම ස්ථාන ප්‍රචලිත කිරීමත් උදෙසා මෙම වර්ෂයේ ද වැඩසටහන් රාශියක් ක්‍රියාත්මක විය. ආකර්ෂණීය ස්ථානයන්හි යටිතල පහසුකම් සංවර්ධනය යටතේ ස්ථාන 15 ක් රු.මි. 55.0 ක් යොදවමින් සංවර්ධනය කරන ලදී. තවද සංචාරක ක්ෂත්‍රයට අදාලව ප්‍රංශ, ජර්මන්, කොරියන් හා චීන භාෂා පාඨමාලාවන් පැවත්වීම, සංචාරක මගපෙන්වන්නන් පුහුණු කිරීම, පාසල් සිසුන් සඳහා පාසල් චාරිකා සමාජ පිහිටුවා සංචාරක ක්ෂේත්‍රය පිළිබඳ දැනුවත් කිරීම, සංචාරක ක්ෂේත්‍රයට සම්බන්ධ වෘත්තිකයන්ගේ කුසලතා සංවර්ධනය උදෙසා වැඩසටහන් පැවැත්විය. තවද සංචාරක ප්‍රවර්ධනය උදෙසා මධ්‍යම පළාත් සංචාරක වෙබ් අඩවිය වැඩිදියුණු කිරීම, සංචාරක තොරතුරු මධ්‍යස්ථානයන්හි පහසුකම් සංවර්ධනය හා අවශ්‍ය තොරතුරු සම්පාදනය කිරීම සිදු කරනු ලබයි. එමෙන්ම වාර්ෂිකව උත්සවාකාරයෙන් ලෝක සංචාරක දිනය සැමරීම හා මහනුවර ඇසළ පෙරහැරට සමගාමීව “visit kandy” සංස්කෘතික සංදර්ශනය විශේෂයෙන් විදේශීය සංචාරකයින් සඳහා පවත්වනු ලබනවා.

මධ්‍යම රජයේ රේඛීය අමාත්‍යංශයේ ප්‍රතිපාදන යටතේ නුවරඑළිය ග්‍රෙගරි වැව ආශ්‍රිතව සංචාරක ආකර්ශනීය ස්ථානයක් ලෙස වැඩිදියුණු කිරීම ඇතුළුව ව්‍යාපෘති 05 ක් සඳහා රු.මි. 119 ක මුදලක් ලබා ගැනීමට හැකිවීම සතුටට කරුණකි. තවද පාසල් හැරයන සිසුන් සඳහා හෝටල් කළමනාකරණ පාඨමාලා පැවත්වීම වෙනුවෙන් ද රු.මි. 3.6 ක් රේඛීය අමාත්‍යංශය මගින් ලබා ගනිමින් අවශ්‍ය කටයුතු කර ඇත. වර්තමානයේ පළාතේ රැකියා

උත්පාදනයට හා ආදායම් උත්පාදනයට සුවිශේෂී දායකත්වය ලබා ගත හැකි සංචාරක අංශයේ සංවර්ධනය වෙනුවෙන් 2017 වර්ෂයට රු.මි. 20.0ක් වෙන්කර දීමට යෝජනා කරමි.

## පුස්තකාල සංවර්ධනය

දැනුම හා තොරතුරු නිදහසේ හා අඛණ්ඩව පරිහරණය කිරීමට අවස්ථාව ලබා දීම අරමුණු කර ගනිමින් 2016 වර්ෂයේදී පුස්තකාල සේවා මණ්ඩලය විසින් ක්‍රියාත්මක කළ වැඩසටහන් අතර පුහුණු වැඩසටහන් හා දැනුවත් කිරීමේ වැඩසටහන් ප්‍රමුඛ වේ. එහි දී භාෂා කඳවුරු, සම්භාව්‍ය කෘති අධ්‍යයනය, සාහිත්‍ය රසවින්දනය, කවි මඩු මෙන්ම පුස්තකාලයාධිපති වරුන්ගේ වෘත්තීය පුහුණු වැඩසටහන් හා පුස්තකාල සංගමයේ විශ්‍රාපන පාඨමාලාව ක්‍රියාත්මක කිරීම ප්‍රධාන විය.

2016 වර්ෂයේ පුස්තකාලය සඳහා පොත් මිලදී ගැනීමට රු.මි. 1.0ක් හා පුස්තකාල සේවා මණ්ඩල ගොඩනැගිල්ල අලුත්වැඩියාව සඳහා රු.මි. 3.5ක් වෙන් කරන ලදි. එමෙන්ම පුස්තකාල සේවා මණඩලය මගින් පුස්තකාල සඳහා ප්‍රමිතියෙන් යුත් මුද්‍රිත ද්‍රව්‍ය හා ලී බඩු අලෙවිය, දේශන ශාලා කුළියට දීම, පාඨමාලා පැවැත්වීම හා පුස්තකාල සාමාජිකත්වය ලබා දීම තුලින් රුපියල් ලක්‍ෂ හතරකට අධික මුදලක් උපයාගෙන ඇත. අපේක්ෂිත අරමුණු ඉටුකර ගැනීම සඳහා අදාළ කාර්යයන් වෙනුවෙන් 2017 වර්ෂය සඳහා රු.මි. 1.0ක් වෙන් කරදීමට යෝජනා කරමි.

## සමූපකාර සංවර්ධනය

සමූපකාර සංවිධානවල යහපාලනය ස්ථාපිත කිරීම උදෙසා සම්පත්දායකයකු, උපදේශකයෙකු, සහාය වන්නෙකු ලෙස කටයුතු කරමින් යහපාලිත සමූපකාර පද්ධතියක් මධ්‍යම පළාත තුළ ස්ථාපිත කිරීම උදෙසා සමූපකාර දෙපාර්තමේන්තුව 2016 වර්ෂයේ දී අදාළ කටයුතු ඉටු කරන ලදි. මධ්‍යම පළාත තුළ ලියාපදිංචි ප්‍රාථමික සමූපකාර සමිති 1,681ක් පවතින අතර ද්විතීයික සමිති යටතේ දිස්ත්‍රික් සමූපකාර මණ්ඩල 03 ක්, සණස සංගම් 06 ක් ද පාරිභෝගික සමූකාර සමිති සංගම් 01 ක් (මහනුවර) ද, සමූපකාර ග්‍රාමීය බැංකු සංගම් 01 (මහනුවර) ද ක්‍රියාත්මක වේ. මධ්‍යම

පළාත තුළ ක්‍රියාත්මක සමිති සතු වත්කම් සලකා බැලීමේ දී ප්‍රාථමික සමිති සතු ස්ථාවර හා ජංගම වත්කම් හි වටිනාකම රු.මි. 18,000 කට අධික වේ. ද්විතීයික සමිති සතු ස්ථාවර හා ජංගම වත්කම්වල වටිනාකම රු.මි. 390 කි.

2016 වර්ෂයේ වෙන් වූ ප්‍රතිපාදන යටතේ දොර්තමේන්තුවෙහි යටිතල පහසුකම් සංවර්ධනය හා පල්ලේකැලේ ගම්උදා භූමියෙහි පිහිටි අධ්‍යාපන හා පුහුණු මධ්‍යස්ථානයේ නේවාසිකාගාරයේ ඉදිකිරීම් කටයුතු ආරම්භ කරන ලදි. ඊට අමතරව සමූපකාර අරමුදල ප්‍රයෝජනයට ගනිමින් පල්ලේකැලේ ගම්උදා භූමියෙහි පිහිටි අධ්‍යාපන හා පුහුණු මධ්‍යස්ථානයේ නේවාසිකාගාරයේ ඉදිකිරීම් කටයුතු සඳහා රු.මි. 6.0ක් යොදවා ඇති අතර සමුපකාර සමිති නිලධාරීන්, රාජ්‍ය නිලධාරීන් පුහුණු කිරීම සඳහා රු.මි. 1.0ක් යොදවා ඇත.

එමෙන්ම මධ්‍යම පළාත තුළ පිහිටි ග්‍රාමීය බැංකු නවීකරණය සඳහා රේඛීය අමාත්‍යංශය මගින් බැංකු ශාඛා 28 ක් සඳහා රු.මි. 10.0කට ආසන්න මුදලක් ලබාගැනීමට හැකි විය. ප්‍රාථමික හා දිස්ත්‍රික් සමිතිවල අරමුදල් යටතේ පළාතේ අදාළ ක්ෂේත්‍රයේ සංවර්ධනය උදෙසා විශාල කාර්යභාරයක් ඉටු කිරීමේ කාලීන අවශ්‍යතාවය පෙන්වා දෙන අතරම 2017 වර්ෂයේ දී සමූපකාර සංවර්ධනය උදෙසා රු.මි. 3.0ක් වෙන් කර දීමට යෝජනා කරමි.

**සෞඛ්‍ය සේවා ප්‍රවර්ධනය**

මධ්‍යම පළාතේ ජනතාවගේ කායික මානසික සමාජ හා අධ්‍යාත්මික සහජීවනය පවත්වා ගනිමින් පළාතේ සෞඛ්‍ය තත්ත්වය උසස් මට්ටමකට ගෙන ඒමේ අභිප්‍රායෙන් රෝග සත්කාර හා රෝග නිවාරණ සේවා ක්‍රියාත්මක කරනු ලබයි. 2016 වසරේ දී සෞඛ්‍ය සේවා ජනතාව වෙත ගෙන යාම වෙනුවෙන් විවිධ මූලාශ්‍ර යටතේ රු. මි. 220 කට ආසන්න මුදලක් වෙන් විය. ඒ යටතේ රෝග සත්කාරක හා නිවාරණ අංශවල යටිතල පහසුකම් සංවර්ධනය, වාට්ටු, බාහිර රෝගී අංශ හා අනෙකුත් සේවා වැඩිදියුණු කිරීම, වෛද්‍ය හා වෛද්‍ය නොවන උපකරණ මිලදී ගැනීම හා සෞඛ්‍ය කාර්ය මණ්ඩල සඳහා නේවාසික පහසුකම් සංවර්ධනය හා සෞඛ්‍ය ක්ෂේත්‍රයේ මානව සම්පත් සංවර්ධනය සඳහා වැඩසටහන් ක්‍රියාත්මක කිරීම තුළින්

තත්ත්වයෙන් උසස් සෞඛ්‍ය සේවාවක් ජනතාවට ලබාදීමට අවශ්‍ය වැඩපිළිවෙල ක්‍රියාත්මක කරන ලදි.

මෙම වසරේදී ප්‍රාදේශීය සෞඛ්‍ය සේවාව ශක්තිමත් කරමින් ජපන් අන්තර්ජාතික සහයෝගිතා ඒජන්සියේ ආධාර යටතේ හා දේශීය අරමුදල් යටතේ ඉදි කරන ලද තෙල්දෙණිය දිස්ත්‍රික් මූලික රෝහල දෙසැම්බර් මස වන විට පළාතේ ජනතාවට සේවා සැපයීම සඳහා ජනතා අයිතියට පත් කිරීමට නියමිතය. එසේම මාතලේ දිස්ත්‍රික්කයේ ව්‍යාප්තවන වකුගඩු රෝගය සඳහා රෝග සත්කාර හා නිවාරණ සේවා සැපයීම වෙනුවෙන් දඹුල්ල දිස්ත්‍රික් මූලික රෝහලේ ඉදි කරන ලද රුධිර පෙරහන් ඒකකය ජනතා අයිතියට පත් කිරීමට නියමිතය. එසේම වකුගඩු රෝග නිවාරණය සඳහා විල්ගමුව ප්‍රාදේශීය රෝහලේ රසයානාගාර හා සායන පහසුකම් වර්ධනයට ද මෙම වසරේ කටයුතු කරන ලදී.

මාතෘ මරණ අනුපාතය 32.2 (සජීවි උපත් 100,000 කට) දක්වාද, ළදරු මරණ අනුපාතය 9.5 (සජීවි උපත් 100,000 කට) දක්වාද, අඩුබර උපත් ප්‍රතිශතය 13.4 දක්වාද, ජලය මගින් බෝවන සෙංගමාල රෝගීන් සංඛ්‍යාව 9.5 (ජනගහනයෙන් 100,000 කට) දක්වාද, එන්නත් වැඩසටහන ශක්තිමත් කිරීම තුළින් සරම්ප රෝගීන් සංඛ්‍යාව 4.4 (ජනගහනයෙන් 100,000 කට) දක්වාද, ජලභීතිකා රෝගීන් සංඛ්‍යාව ශූන්‍ය මට්ටම දක්වාද අවම කර ගැනීමට සමත් වීම පළාතේ සෞඛ්‍ය අංශය ලද ජයග්‍රහණයකි.

ලෙඩ රෝග වළක්වා ගැනීමට හුරුපුරුදු සමාජයක් තුළින් රෝග නිවාරණ කටයුතු ශක්තිමත් කිරීමත්, තත්ත්වයෙන් උසස්, සමානාත්මතාවයෙන් යුතු ජනතා හිතවාදී සෞඛ්‍ය සේවාවක් ඇති කිරීමත්, විශේෂයෙන් අවධානය යොමු කළ යුතු වතු ආශ්‍රිත සෞඛ්‍ය සේවාව වැඩිදියුණු කිරීම, කායික හා මානසික පීඩාවට පත් වූ රෝගීන් පුනරුත්ථාපනය කිරීම, ව්‍යාප්ත වෙමින් පවතින වකුගඩු රෝගී තත්ත්වය අවම කිරීම හා සෞඛ්‍ය සම්පන්න හා ආරක්ෂිත සේවා ස්ථාන නිර්මාණය කිරීම යනාදී පුමුඛ කාර්යයන් සඳහා සෞඛ්‍ය අංශයේ දැඩි අවධානය යොමු කළ යුතුව තිබේ. පළාතේ ප්‍රජාවගේ නිරෝගී සුව පැවැත්ම තහවුරු කිරීම උදෙසා අදාළ කාර්යයන් ඉටු කිරීමට 2017 වර්ෂය සඳහා රු.මි. 275.0 ක් වෙන් කර දීමට යෝජනා කරන අතර, ලෝක බැංකු ආධාර යටතේ රු.මි. 360.0ක් ද වෙන්කර දීමට යෝජනා කරමි.

### ආයුර්වේද කටයුතු සංවර්ධනය

මධ්‍යම පළාත තුළ සෞඛ්‍ය සම්පන්න ජනතාවක් බිහි කිරීම උදෙසා ආයුර්වේද දැනුම සංවර්ධනය කර ප්‍රායෝගිකව යොදා ගනිමින් නිවාරන හා ප්‍රතිකාර සේවා ජාලයක් පළාත තුළ ඇති කිරීම උදෙසා 2016 වර්ෂයේදී රු.මි. 121 ක ප්‍රතිපාදන යටතේ වැඩසටහන් දියත් කෙරිණ. එහිදි විශේෂයෙන් සම්ප්‍රදායික වෛද්‍ය ක්‍රම සංරක්ෂණය හා ප්‍රවර්ධනය කිරීම, ඖසු උයන් හා ඖෂධ නිෂ්පාදනය ඉහළ නැංවීම තුළින් පළාතට අවශ්‍ය ඖසු පළාත තුළම නිපදවීමේ යාන්ත්‍රණය ශක්තිමත් කිරීම, ආයුර්වේද ප්‍රජා සෞඛ්‍ය සේවා ව්‍යාප්ත කිරීම, දේශීය හා විදේශීය පාරම්පරික වෛද්‍ය දැනුම හුවමාරු කර ගැනීම තුළින් මධ්‍යම පළාතේ ජනතාවට වඩා හොඳ සෞඛ්‍ය තත්ත්වයක් ළඟා කරදීමට කටයුතු කරන ලදී.

තව දුරටත් ආයුර්වේද ප්‍රජා සත්කාර සේවා පුළුල් කිරීමටත්, රාජ්‍ය, පෞද්ගලික හා ප්‍රජා දායකත්වය ඇතිව ආයුර්වේද සත්කාර සේවා ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමටත්, දෙස් විදෙස් සංචාරක කර්මාන්තය ඉලක්ක කර ගනිමින් නවීන අවශ්‍යතාවයන්ට අනුකූලව නිර්මාණය වූ ආයුර්වේද ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම කෙරෙහි අවධානය යොමු කළ යුතුව ඇත. මෙකී කාර්යයන් ප්‍රවර්ධනය උදෙසා 2017 වර්ෂය සඳහා රු.මි. 46.0 ක් වෙන් කරදීමට යෝජනා කරමි.

### පරිවාස හා ළමාරක්ෂක සේවා

දෙමව්පියන්ගේ රැකවරණය හා ආරක්ෂාව අහිමිව අසරණභාවයට පත් වූ දරු දැරියන්ට නිසි රැකවරණය හා නිසි අධ්‍යාපනයක් ලබාදෙමින් ඔවුන් යහපත් පුරවැසියන් ලෙස සමාජගත කිරීම අපගේ වගකීම හා යුතුකම ද වේ. දෙමාපියන් විසින් හැරයන දරුවන් මෙන්ම විවිධ අපචාර හේතුකොට ගෙන අධිකරණය මගින් පරිවාස භාරයට පත් කෙරෙන ළමුන් පිළිබඳව කටයුතු කිරීම සඳහා පරිවාස කාර්යාල, රජයේ ළමා නිවාස හා රැඳවුම් මධ්‍යස්ථාන මෙන්ම ස්වේච්ඡා ළමා නිවාස ද පළාත තුළ පවත්වාගෙන යනු ලැබේ.

මධ්‍යම පළාත තුළ ස්ථාපිත පරිවාස කාර්යාල 10ක් තිබෙනවා. "ටිකිරි සෙවන" රජයේ භාර ගැනීමේ ළමා නිවාසය හා වේරවලවත්ත ළමා රැඳවුම් නිවාසය දෙපාර්තමේන්තුවේ පාලනය යටතේ පවතින අතර, ස්වේච්ඡා ළමා නිවාස 36 ක් සහ ආබාධිත ළමා නේවාසිකාගාර 4 දෙපාර්තමේන්තුවේ සෘජු අධීක්ෂණය යටතේ ක්‍රියාත්මක වෙනවා.

මෙලෙස මාපිය සෙනෙහස අහිමි වූ ළමයින් රැකබලා ගනිමින්, ඔවුන් සමාජ හිතකාමී පිරිසක් බවට පත්කරමින් සමාජගත කිරීම සුළුපටු කාර්යයන් නොවන බව කිව යුතුමය. මෙම කාර්යයන් වෙනුවෙන් රාජ්‍ය අංශයෙන් බැහැර අරමුදල් මූලාශ්‍ර කෙරෙහි අවධානය යොමු කිරීම ද වැදගත් වේ. සාමජයේ අවධානය යොමු විය යුතු පරිවාස හා ළමාරක්ෂක කටයුතු වෙනුවෙන් 2017 වර්ෂය සඳහා රු.මි.7.0ක් වෙන් කිරීමට යෝජනා කරමි.

**සමාජ සේවා කටයුතු**

පවුල් ඒකකවල නිසි රැකවරණය නොමැතිව වයස්ගත මෙන්ම ආබාධිතව අසරණභාවයට පත් වූ වැඩිහිටියන් රැකබලා ගැනීම සඳහා අවශ්‍ය පහසුකම් සලසා දීම අපගේ වගකීමකි. විශේෂයෙන්ම වයස්ගත ජනගහනය, එනම් වයස අවුරුදු 60 හෝ ඊට වැඩි පුද්ගලයන්ගේ සංඛ්‍යාව වේගයෙන් වැඩිවන පසුබිමක් තුළ ඔවුන් සමාජයට බරක් නොකොට පවුල් ඒකක තුළ ඔවුන්ගේ සුරක්ෂිතභාවය තහවුරු කිරීමට කටයුතු කළ යුතුව ඇත. එසේම දැනට පළාත තුළ පවත්වාගෙන යනු ලබන වැඩිහිටි නිවාස 17 හි සේවාවන් තවදුරටත් පෞද්ගලික ආධාර උපකාර යටතේ වැඩිදියුණු කිරීමට කටයුතු කළ යුතුව ඇත. පළාත පුරා විසිරී සිටින තෝරාගත් ප්‍රතිලාභීන් වෙත මහජනාධාර, රෝගාධාර සහ ආබාධිත උපකරණ ලබාදීම යනාදී කටයුතු ද සමාජ සේවා යටතේ ඉටු කරනු ලබනවා. මෙවැනි කටයුතු අඛණ්ඩව පවත්වාගෙන යාම සඳහා 2017 වර්ෂය වෙනුවෙන් රු.මි. 6.0ක් වෙන් කරදීමට යෝජනා කරමි.

**කෘෂිකර්ම සංවර්ධනය**

ගරු සභාපතිතුමනි,

ජාතික ආහාර නිෂ්පාදන වැඩසටහනට සමගාමීව මධ්‍යම පළාත තුළ වස විසෙන් තොර ආහාර නිපදවා ජනතාවගේ පෝෂණ තත්ත්වය වැඩිදියුණු කිරීමත් ඒ තුළින් පළාතේ බෝ නොවන රෝග වළක්වා ගැනීමත් කෘෂිකාර්මික සංවර්ධනයේ දී අපගේ ප්‍රධාන අපේක්ෂාවන් වේ. මධ්‍යම පළාතේ කෘෂිකාර්මික ක්ෂේත්‍රයට ඉහළ වටිනාකමක් එක් කරනු ලබන ලොකු ළූණු බීජ නිෂ්පාදනය, බීජ අර්තාපල් නිෂ්පාදනය හා බීජ බෝංචි නිෂ්පාදනයට හිමිවන්නේ සුවිශේෂි ස්ථානයකි. 2016 වර්ෂයේ දී රු.මි. 17.4 ක් ලොකු ළූණු නිෂ්පාදනය සඳහා වෙන් කෙරුණු අතර, ජාතික ලොකු ළූණු අවශ්‍යතාවයෙන් 50%ක් මධ්‍යම පළාතෙන් සපයා දෙමින්, ඊට අමතරව බීජ කිලෝ ග්‍රෑම් 20,000ක් නිපදවීමට ද කටයුතු කර ඇත. එය 2017 වර්ෂයේ දී බීජ කිලෝ ග්‍රෑම් 22,000ක ඉලක්කයක් දක්වා වැඩි කිරීමට අපේක්ෂිතය. බීජ අර්තාපල් නිෂ්පාදනය 2016 වර්ෂයේ දී මෙට්‍රික් ටොන් 8,000 ක් වන අතර, ඉදිරියේ දී ජාතික බීජ අවශ්‍යතාවයෙන් 60% ක් දක්වා නිපදවීමට සැලසුම් කර ඇත.

ගුණාත්මක බෝංචි බීජ නිෂ්පාදනය කරමින් බීජ ආනයන වියදම අවම කර දේශීය බීජ ප්‍රචලිත කිරීම හා බීජ ආනයනය සඳහා වන විදේශ විනිමය ඉතිරිකර ගැනීමට ද සැලසුම් කර ඇත. මෙම ව්‍යාපෘතිය මධ්‍යම පළාතට ආවේනික බීජ නිෂ්පාදන වැඩසටහනකි. ජාතික බීජ නිෂ්පාදන අවශ්‍යතාවය කිලෝග්‍රෑම් 375,000ක් පමණ වන අතර දැනට මෙය සපයනු ලබන්නේ නුවරඑළිය දිස්ත්‍රික්කයෙන් වීම පළාතට ලැබෙන ඉමහත් ගෞරවයකි. මෙම දායකත්වය 2017 වර්ෂයේදී 55% දක්වා ඉහළ නැංවීමට අපේක්ෂිතය. මෙම බීජ නිෂ්පාදන වැඩසටහන්වලට අමතරව නිෂ්පාදනය හා ඵලදායිතාවය වැඩි කිරීම යටතේ මල් හා පලතුරු පැල තවාන් ඇති කිරීම, කාබනික පොහොර නිෂ්පාදනය, පාංශු පරීක්ෂාව, නගර උයන්වතු සංවර්ධනය හා වතු අංශයේ ගෙවතු සංවර්ධනය, වී වගා සංවර්ධනය, මිරිස්, බඩඉරිඟු, මුං, කුරක්කන් රතුළූණු නිෂ්පාදනය වැඩි කිරීම, කෘෂි ළිං ඉදි කිරීම හා විශේෂයෙන්ම වතු ආශ්‍රිත ජනතාවගේ පෝෂණ මට්ටම ඉහළ නැංවීම ආදිය කෘෂිකාර්මික සංවර්ධනයේ දී විශේෂ අවධානය යොමු වූ ක්ෂේත්‍රයන්ය.

කුඩා හා මධ්‍ය පරිමාණ වගාකරුවන් සඳහා පහසුකම් සැපයීම, කෘෂි නිෂ්පාදන කර්මාන්ත ප්‍රචලිත කිරීම හා අගය එකතු කළ වටිනාකම් සහිත කර්මාන්ත (Value added industries) ප්‍රචලිත කිරීම, වගා නොකරන කුඹුරු වෙනත් වගාවන් සඳහා යෙදවීම යනාදී වැඩසටහන් රාශියක් ද යටිතල පහසුකම් සංවර්ධනය හා මානව සම්පත් සංවර්ධනයට අදාළ වැඩසටහන් ද අප ප්‍රදේශය තුළ ක්‍රියාත්මක කරනු ලැබේ. මේ අනුව 2017 වර්ෂයේ දී කෘෂි කර්මාන්ත සංවර්ධනය සඳහා රු.මි. 56.0ක් වෙන් කරදීමට යෝජනා කරමි.

ගරු සභාපතිතුමනි,

කෘෂි නිෂ්පාදනවල ඵලදායිතාව ඉහළ මට්ටමක පවත්වාගෙන යාමට නම් කෘෂි ප්‍රවේශ මාර්ග පද්ධතිය නඩත්තු කොට පවත්වාගෙන යාම අත්‍යාවශ්‍ය කරුණක් බව කිව යුතුය. අවසන් නිමවුම වෙළඳපල වෙත ප්‍රවාහනය කිරීමේදී සිදුවන හානි අවම කරගැනීමෙන් නිෂ්පාදනය අපතේ යාම වළක්වා අප රට තුළ කෘෂිකාර්මික ක්ෂේත්‍රයෙන් ජාතික ආදායමට ලැබෙන දායකත්වය ඉහළ නැංවීමට ද හැකිවනු ඇත. එමෙන්ම පොහොර, බීජ වැනි යෙදවුම් ද්‍රව්‍ය ප්‍රවාහනය ද පහසු වනු ඇත. එබැවින් මෙම අයවැය තුළින් කෘෂි ප්‍රවේශ මාර්ග සංවර්ධනය සඳහා රු.මි. 5.0ක් වෙන් කරදීමට යෝජනා කරමි.

තවද ගරු සභාපතිතුමනි, වතු අංශයේ මාර්ග සංවර්ධනය කිරීම හා නඩත්තු කරදීම ද අපගේ වගකීමකි. වතුකරය ආශ්‍රිතව සිදු කෙරෙන නිෂ්පාදනයන් විශේෂයෙන්ම තවමත් අප රටේ ජාතික ආදායමට විශාල දායකත්වයක් සපයන තේ, එළවළු, පළතුරු, කිරි ආදී නිෂ්පාදන වෙළඳපලට කඩිනමින් සැපයීම සඳහා සුදුසු මාර්ග පද්ධතියක් වතුකරය ආශ්‍රිතව පවත්වාගෙන යාම අත්‍යවශ්‍ය කරුණකි. මේ සඳහා 2017 වර්ෂයට රු.මි. 15.0 ක් වෙන් කරදීමට යෝජනා කරමි.

**සුළු වාරිමාර්ග සංවර්ධනය**

පළාත පුරා විහිදී තිබෙන මධ්‍යම හා මහා පරිමාණ වාරිමාර්ග සංවර්ධනය රේඛීය අමාත්‍යංශය මගින් ක්‍රියාත්මක කෙරෙන අතර පළාතේ දිස්ත්‍රික්ක 03 පුරා විහිදී ඇති සුළු වාරිමාර්ග පද්ධතිය ප්‍රතිසංස්කරණය කිරීමේ වගකීම පැවරී ඇත්තේ අප පළාත් සභාවටය. කෘෂිකර්මාන්තයේ අඛණ්ඩ පැවැත්ම

සඳහා වාරි ජල කළමනාකරණය මනාව පවත්වා ගැනීමට අවශ්‍ය සේවාවන් හා අලුත්වැඩියාවන් කරමින් වගා නොකළ ඉඩම් නැවත වගා කිරීම සඳහා යොමු කරවමින් වාරිමාර්ග සංවර්ධන කටයුතු සිදු කෙරෙන අතර එම කටයුතු අඛණ්ඩව පවත්වාගෙන යාම සඳහා 2017 වර්ෂය වෙනුවෙන් රු.මි. 15.0ක් වෙන් කර දීමට යෝජනා කරමි.

**සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය කටයුතු**

පශු සම්පත් ක්ෂේත්‍රයේ අපගේ ප්‍රධාන කාර්යභාරය කිරි නිෂ්පාදනය ඉහළ නැංවීමයි. වර්තමානයේ ජාතික කිරි අවශ්‍යතාවය වාර්ෂිකව කිරි ලීටර් මිලියන 900 කි. එයින් කිරි ලීටර් මිලියන 316 ක් දේශීය කිරි නිෂ්පාදනයෙන් සපුරා ගැනීමට කටයුතු කරන අතර ඒ සඳහා මධ්‍යම පළාතේ දායකත්වය කිරි ලීටර් මිලියන 131.2 කි. 2017 වර්ෂයේ දී ලීටර් මිලියන 150 දක්වා මෙම ප්‍රමාණය වැඩි කරගැනීමට ඉලක්ක කර ඇත. කිරි ආශ්‍රිත නිෂ්පාදන දිරි ගැන්වීම, කෘත්‍රිම සිංචනය මගින් දෙමුහුන් පැටවුන් බෝකිරීම සහ ප්‍රවර්ධනය කිරීම කිරි එකතු කිරීමේ සහ ගබඩා කිරීමේ පහසුකම් සැපයීම සහ පශු සම්පත් සංවර්ධන ක්ෂේත්‍රයේ කාර්යක්ෂම සේවාවක් සහතික කරමින් සත්ත්ව ගොවිපලවල් සඳහා පහසුකම් සැපයීම ඇතුළු ව්‍යවසායකයන් සවිබල ගැන්වීමේ වැඩසටහන් රැසක් පසුගිය කාල වකවානුව තුළ ක්‍රියාත්මක කර ඇත. මෙම කටයුතු ප්‍රවර්ධනය වෙනුවෙන් රු.මි. 36.0ක් වෙන් කිරීමට යෝජනා කරමි.

**මිරිදිය ධීවර කටයුතු සංවර්ධනය**

මධ්‍යම පළාතේ ජනතාවගේ පෝෂණ තත්ත්වය ඉහළ නැංවීමේ අරමුණින් ආරම්භ කර ක්‍රියාත්මක කරනු ලබන මිරිදිය ධීවර සංවර්ධන වැඩසටහන, මත්ස්‍ය ඇඟිල්ලන් මුදාහැරීම, ධීවර කර්මාන්තයේ නියැලෙන්නන්ගේ සුබසාධනය, විසිතුරු මත්ස්‍ය වගාව සංවර්ධනය යනාදී කටයුතු කර ඇත. මෙම කටයුතු අඛණ්ඩව පවත්වාගෙන යාම සඳහා 2017 වර්ෂයට රු.මි. 2.0 ක් වෙන් කිරීමට යෝජනා කරමි.

## පරිසර සංවර්ධනය

ජාතික පරිසර සංරක්ෂණ වැඩසටහනට සමගාමීව මධ්‍යම පළාතේ පරිසරය සුරක්ෂිත කරමින් පවත්වාගෙන යාම සඳහා රුක් රෝපණ වැඩසටහන්, කසළ කළමනාකරණ වැඩසටහන්, පරිසරය පිරිසිදු කිරීමේ ශ්‍රමදාන වැඩසටහන් පවත්වා ඇති අතර එකී පාරිසරික සත්කාරයන් අඛණ්ඩව ඉදිරියට ගෙන යාමට සැලසුම් කර ඇත. මේ සඳහා 2017 වර්ෂයට රු.මි. 2.0ක් වෙන් කරදීමට යෝජනා කරමි.

## හින්දු සංස්කෘතික කටයුතු

පළාතේ හින්දු ජනතාවගේ ආගමික හා සංස්කෘතික කටයුතු කෙරෙහි අවධානය යොමු කරමින් 2016 වර්ෂයේදී විවිධ වැඩසටහන් ක්‍රියාත්මක කළ අතර 2017 වර්ෂයේදී එකී කටයුතු වෙනුවෙන් රු.මි. 2.0ක් වෙන් කරදීමට යෝජනා කරමි.

## කර්මාන්ත සංවර්ධන හා ව්‍යාපාර ප්‍රවර්ධනය

ගරු සභාපතිතුමනි,

රැකියා දස ලක්ෂයේ වැඩසටහනට සමගාමීව මධ්‍යම පළාත තුළ 2016 වසරේ රැකියා වියුක්තික තරුණ තරුණියන් 1000 කට වෘත්තීය පුහුණුව ලබාදී ඇති අතර ඔවුන් වඩු කර්මාන්ත, ලුහු ඉංජිනේරු, සම්භාණ්ඩ යනාදී වශයෙන් ඉල්ලුමක් ඇති ක්ෂේත්‍රයන්වල මේ වන විටත් රැකියා ගැන්වීමට කටයුතු කර ඇත. ව්‍යවසායකත්ව පුහුණුව, පුහුණු ආයතන සංවර්ධනය කිරීම, ශිල්ප අභිමානී පළාත් හස්ත කර්මාන්ත ප්‍රදර්ශනය, ශිල්පීන් ඇගයීම, හස්ත කර්මාන්ත ගම්මාන සංවර්ධනය හා විකුණුම්කරුවන්ගේ සහ ගැනුම්කරුවන්ගේ හමුවක් සංවිධානය කිරීම යනාදී කාර්යයන් 2016 වර්ෂය තුළ ඉටු කිරීමට හැකි විය. එසේම දේශීය නිෂ්පාදන දිරිගැන්වීමේ ජාතික වැඩසටහනට සමගාමීව වෘත්තීය පුහුණුව තුළින් තරුණ තරුණියන් කුසලතා පූර්ණ පිරිසක් ලෙස ශ්‍රම බලකායට සම්බන්ධ කිරීමත්, ව්‍යවසායකත්ව දැනුම ලබාදීම තුළින් නව ව්‍යාපාර බිහි කිරීමත්, පවතින ව්‍යාපාර ප්‍රවර්ධනයටත් මගපෙන්වීම කළ යුතුව ඇත. තවද විදේශීය රැකියා

සඳහා සුදුසු ශ්‍රම බලකායක් ගොඩනැංවීම, හස්ත කර්මාන්ත ක්ෂේත්‍රයේ පවුල්වල සංවර්ධනය, හස්ත කර්මාන්ත නොවන අනෙකුත් සුළු හා මධ්‍යම පරිමාණ ව්‍යවසායකයින් නගා සිටුවීම යන කාර්යයන් තවදුරටත් ඉටු කළයුතු වේ. මෙම කටයුතු ප්‍රවර්ධනය වෙනුවෙන් 2017 වර්ෂය සඳහා රු.මි. 9.0ක් වෙන් කර දීමට මා යෝජනා කරමි.

**පේෂ කර්මාන්ත සංවර්ධනය**

දේශීය රෙදිපිළි ප්‍රචලිත කිරීම උදෙසා මෙම වසරේ තෙවන කාර්තුව වනවිට නිෂ්පාදනය කර ඇති රෙදි ප්‍රමාණය මීටර් 115,000ක් පමණ වන අතර, එහි වටිනාකම රු.මි. 45ක් පමණ වේ. මේ වනවිට නිෂ්පාදන අලෙවි ආදායම රු.මි. 48ක් පමණ වන අතර, සැප්තැම්බර් 30 වනවිට කාර්මිකාවන් වෙනුවෙන් වැටුප් ලෙස රු.මි. 16කට අධික මුදලක් ගෙවා ඇත.

පේෂ කර්මාන්ත සංවර්ධනය සඳහා මධ්‍යම පළාත පුරා සේවා නියුක්තව සිටින කාර්මිකාවන් සංඛ්‍යාව 1,000කට ආසන්නය. අලෙවි සැල් නවීකරණය, විකුණුම්කරුවන්ගේ සහ ගැණුම්කරුවන්ගේ හමුවක් පැවැත්වීම, කාර්මිකාවන්ගේ ආදායම ඉහළ දැමීම, පුහුණු වැඩසටහන් පැවැත්වීම, ශිල්පීන් දිරිගැන්වීම සඳහා කුසලතා අගය කිරීම, යන්ත්‍ර උපකරණ අලුත්වැඩියාව හා අබලන් වූ පේෂ කර්මාන්ත අලෙවි සැල් හා නිෂ්පාදන ආයතන අලුත්වැඩියා කිරීම, ආදර්ශ මධ්‍යස්ථාන 03ක් ඇති කිරීම, තෝරාගත් ආයතන සඳහා ජලය හා විදුලිය ලබාදීම, පළාත් ප්‍රදර්ශන පැවැත්වීම, ශිල්පීන් ඇගයීම යනාදී කාර්යයන් මෙම වසරේ දී ඉටු කිරීමට හැකිවිය.

දේශීය නිෂ්පාදන භාවිතය දිරිගැන්වීම සඳහා පේෂකර්ම රෙදිපිළි නිෂ්පාදනය සඳහා නව හඳුන්වාදීම් තුළින් දෙපාර්තමේන්තුවේ නිෂ්පාදනය හා අලෙවිය ඉහළ නැංවීමටත්, ඒ තුළින් කාර්මික ආදායම ඉහළ නැංවීමටත්, අබලන්ව ඇති පෙහෙකම් මධ්‍යස්ථාන අලුත්වැඩියා කිරීමටත්, නව රැකියා අවස්ථා ඇති කිරීමටත් ඉදිරියේ දී කටයුතු කළ යුතුව ඇත. මෙම කාර්යයන් වැඩිදියුණු කරමින් පවත්වාගෙන යාම සඳහා 2017 වර්ෂයට රු.මි. 5.0ක් වෙන් කර දීමට යෝජනා කරමි.

**තරුණ කටයුතු සංවර්ධනය**

මධ්‍යම පළාත තුළ සිටින තරුණ තරුණියන් ඒකරාශී කිරීම, තරුණ ක්‍රියාධරයන් කණ්ඩායම්ගත කිරීම, තරුණ පරපුර තුළ ජාතික සහයෝගිතාව වර්ධනය කිරීම, සේවා වියුක්තිය අවම කිරීම සඳහා දේශීය හා විදේශීය රැකියා වෙළඳපල ඉලක්ක කර ගනිමින් තරුණ තරුණියන් පුහුණු කිරීම, ජාතික ඒකාබද්ධතාවය ඇති කිරීම සඳහා භාෂා කුසලතා වර්ධනය කිරීම, වතුකරයේ තරුණ තරුණියන් රැකියා වෙළඳපල සඳහා යොමු කිරීම යනාදී වැඩසටහන් මෙම වසරේ දී ක්‍රියාත්මක කරන ලදි. මෙම කාර්යයන් තවදුරටත් පවත්වාගෙන යාමට 2017 වර්ෂය සඳහා රු.මි. 4.0ක් වෙන් කිරීමට යෝජනා කරමි.

**වනිතා කටයුතු සංවර්ධනය**

මධ්‍යම පළාතේ වනිතා සංවර්ධනය යටතේ කාන්තාවන් 7,000කට ආසන්න පිරිසක් වෙනුවෙන් මෙම වර්ෂයේ දී වැඩසටහන් ක්‍රියාත්මක කරන ලදී. මෙම පිරිසට සංවර්ධන ක්‍රියාකාරකම් 112ක් ක්‍රියාත්මක කළ අතර, රැකියා විරහිත කාන්තාවන් 2,544කට වෘත්තීය පුහුණුව ලබාදීම, ව්‍යවසායිකාවන් 717ක් සඳහා නිෂ්පාදන ධාරිතාවය වැඩි කරමින් ආදායම් තත්ත්වය ඉහළ නැංවීම, එලදායිතාව ආශ්‍රිතව කාන්තාවන් 3,710ක් සමාජීය වශයෙන් බල ගැන්වීම සිදුකර ඇත. එමෙන්ම කාන්තා උපදේශනය, නීති ගැටළු විසඳීම, මානව හිමිකම් පිළිබඳ දැනුවත් කිරීම සඳහා ද කටයුතු කර ඇත.

මධ්‍යම පළාතේ ස්ථාපිත කාන්තා සමිති තවදුරටත් සක්‍රිය කරවමින් කාන්තා සංවර්ධනයට නව ප්‍රවේශයක් ලබාදීම, කාන්තාව ආර්ථික, තාක්ෂණික හා සමාජීය වශයෙන් බලගැන්වීම, උපදේශන සේවා වැඩසටහන්වලට අදාළව නීති හා මනෝ විද්‍යාත්මක උපදේශනය, මතින් තොර පවුල් ඒකක ගොඩනැගීම පිළිබඳ දැනුවත් කිරීම, ළමා අපචාර හා කාන්තා හිංසනය අවම කිරීම පිළිබඳ දැනුවත් කිරීම හා ලියසෙවන මධ්‍යස්ථානවල යටිතල පහසුකම් සංවර්ධනය කිරීමට කටයුතු කළ අතර, මෙම කටයුතු ප්‍රවර්ධනය කිරීම වෙනුවෙන් 2017 වර්ෂයට රු.මි.4.0ක් වෙන් කිරීමට මා යෝජනා කරමි.

## ක්‍රීඩා සංවර්ධනය

මධ්‍යම පළාතේ ක්‍රීඩා සංවර්ධනය වෙනුවෙන් වාර්ෂිකව පවත්වන ජාතික මහා ක්‍රීඩා උළෙලට ක්‍රීඩකයින් පුහුණු කිරීමට සමගාමීව 2016 වර්ෂයේ ජාතික මහා ක්‍රීඩා උළෙලේ පැවති තරගවලින් රන් පදක්කම් 28ක්, රිදී පදක්කම් 38ක් හා ලෝකඩ පදක්කම් 41ක් මධ්‍යම පළාත විසින් දිනාගෙන තෙවන ස්ථානය හිමි කරගන්නා ලදි. එමෙන්ම ජය ලබාගෙන පළාතේ අභිමානය රැකගැනීමට කටයුතු කරන ක්‍රීඩක ක්‍රීඩිකාවන් ඇගයීම සඳහා පළාත් ක්‍රීඩා උපහාර උළෙලක් පවත්වා මධ්‍යම පළාතේ ක්‍රීඩක ක්‍රීඩිකාවන් වෙනුවෙන් උපහාර පිරිනැමීමටත්, ප්‍රාදේශීය වශයෙන් ක්‍රීඩික ක්‍රීඩිකාවන් ඇගයීමටත් කටයුතු කර ඇත. එසේම දිගන ක්‍රීඩාංගනය ඉදිරි දිනක මහජනතාවට විවෘත කිරීමත් සමග ක්‍රීඩා දෙපාර්තමේන්තුව දිගන ක්‍රීඩාංගණ පරිශ්‍රයේ ස්ථාපිත කිරීමට කටයුතු කර ඇත.

පොදු ජනතාවගේ ශාරීරික සුවතාවය හා විනෝද කටයුතු සඳහා 2016 වර්ෂය තුළ වැඩි අවධානයක් යොමු කළ අතර පළමු පෙළ ක්‍රීඩා සංචිත වැඩසටහන හා ක්‍රීඩා සමාජ, දිස්ත්‍රික් පුහුණු මධ්‍යස්ථාන සඳහා උපකරණ ලබාදීමත් සිදු කරන ලදි.

ක්‍රීඩාව පිළිබඳ උනන්දුවක් ඇති කිරීම සඳහා ක්‍රීඩා සංස්කෘතියක් ගොඩ නැගීමටත්, දෙවන පෙළ සංචිතය තවදුරටත් පවත්වා ගැනීම ඇතුළු හඳුනාගත් නව වැඩසටහන් ක්‍රියාත්මක කරමින් ජාතික මහා ක්‍රීඩා උළෙලේ පළාතට ලබාගත හැකි පදක්කම් සංඛ්‍යාව වැඩි කරගැනීම සඳහා ඉලක්කගත වැඩපිළිවෙලක් ක්‍රියාවට නැංවිය යුතුව ඇත. එමෙන්ම මධ්‍යම පළාත තුළ පසුබෑමකට ලක්ව ඇති ක්‍රීඩාවන් හඳුනාගෙන නවක ක්‍රීඩක ක්‍රීඩිකාවන් මෙම ක්‍රීඩාවන් කෙරෙහි යොමු කිරීමටද කටයුතු කළ යුතුය.

මෙම කාර්යයන් ඉටු කරනු ලබන අතරතුර අධ්‍යාපන දෙපාර්තමේන්තුව හා ක්‍රීඩා දෙපාර්තමේන්තුව ඒකාබද්ධව පළාතේ ක්‍රීඩා කටයුතු සංවර්ධනය සඳහා ඉදිරියේදී ක්‍රියා කළ යුතු බව සඳහන් කරමි. මේ අනුව 2017 වර්ෂය සඳහා ක්‍රීඩා සංවර්ධනය වෙනුවෙන් රු.මි. 8.0ක් වෙන් කිරීමට මා යෝජනා කරමි.

## ග්‍රාම සංවර්ධන කටයුතු

මධ්‍යම පළාතේ ග්‍රාම සංවර්ධන දෙපාර්තමේන්තුව "තිරසාර ග්‍රාම සංවර්ධනයක්" යන දැක්ම ඔස්සේ මධ්‍යම පළාත තුළ ග්‍රාමීය ජනතාවගේ සහභාගීත්වය ඇතිව ඔවුන්ගේ සුබසිද්ධිය සඳහා සංවර්ධන ව්‍යාපෘති රාශියක් ක්‍රියාත්මක කර ඇත. ප්‍රධාන වශයෙන් ග්‍රාමීය යටිතල පහසුකම් සංවර්ධනය, ග්‍රාම සංවර්ධන සමිති ශක්තිමත් කිරීම, ග්‍රාමීය සමාජ ආර්ථික සංවර්ධනය සහ ධාරිතා සංවර්ධනය යන වැඩසටහන් සිදු කිරීම තුළින් ග්‍රාමීය ජනතාවගේ ජීවන තත්ත්වය නංවාලීමට දායකත්වය ලබාදී ඇත.

මෙරට ග්‍රාම සංවර්ධන ව්‍යාපාරයේ ඉහළම සාර්ථකත්වයක් ලඟා කරගනිමින් මධ්‍යම පළාත නව ග්‍රාම සංවර්ධන සමිති ව්‍යවස්ථාවක් හඳුන්වාදීම තුළින් ග්‍රාම සංවර්ධන සමිති ශක්තිමත් කිරීම සහ ග්‍රාම සංවර්ධන ප්‍රාදේශීය බල මණ්ඩල පිහිටුවීම සුවිශේෂී ජයග්‍රහණයකි. ඒ තුළින් මධ්‍යම පළාත තුළ මේවනවිට ක්‍රියාකාරී ග්‍රාම සංවර්ධන සමිති 2,238 ක් පමණ පිහිටුවා ඇත. එමෙන්ම ප්‍රාදේශීය බල මණ්ඩල 36ක් පිහිටුවා ඇත. ග්‍රාම සංවර්ධන සමිති අරමුදල් තුළින් රජයට බරක් නොවී ග්‍රාම සංවර්ධන ව්‍යාපෘති අති විශාල සංඛ්‍යාවක් මෙම වසර තුළ ක්‍රියාත්මක කිරීමට හැකියාව ලැබී ඇත. එමෙන්ම ග්‍රාම සංවර්ධන දෙපාර්තමේන්තුව සඳහා නව ගොඩනැගිල්ලක් ඉදි කිරීම හා ග්‍රාම සංවර්ධන ප්‍රඥප්තිය අනුමත කර ගැනීම ද මෙම වසරේ දී ලද ජයග්‍රහණයකි.

ඉහත කාර්යයන්ට අමතරව මධ්‍යම පළාතේ ඵලදායිතා ගම්මාන බිහි කිරීම, ග්‍රාම සංවර්ධන ව්‍යාපාරය ශක්තිමත් කිරීම, ග්‍රාමීය කාන්තා අභිවෘද්ධි වැඩසටහන් ප්‍රවර්ධනය කිරීම යනාදී කටයුතු ඉටු කළ යුතුව ඇත. මේ අනුව 2017 වර්ෂය සඳහා රු.මි. 8.0ක් වෙන් කිරීමට මා යෝජනා කරමි.

## පළාත් මාර්ග සංවර්ධනය

ගරු සභාපතිතුමනි,

2016 වර්ෂයේ දී වෙන් වූ රු.මි. 483 ආයෝජනය කරමින් අත්‍යාවශ්‍ය මාර්ග 93ක කි.මි. 63ක් සංවර්ධනය කර ඇත. මේ අනුව මාර්ග තාර යොදා ප්‍රතිසංස්කරණය කිරීමත්, මාර්ග නිර්මිත වන බෝක්කු, කාණු හා පැති බැම්

ඉදිකිරීමත් කර ඇත. සාමාන්‍ය තත්ත්වයන් යටතේ මාර්ග භාවිතයේ දී මාර්ග පිළිසකර කිරීමේ අවශ්‍යතාවයට අමතරව ස්වාභාවික විපත් (නාය යෑම්, අධික වර්ෂාව) හේතුවෙන් අනපේක්ෂිත ලෙස මාර්ග පද්ධතියේ සිදු කළ යුතු සංවර්ධන කාර්යයන් සඳහා වාර්ෂිකව අයවැය මගින් වෙන්වන ප්‍රතිපාදනවලට අමතරව මහා භාණ්ඩාගාරයෙන් ප්‍රතිපාදන ලබාගැනීම සඳහා ව්‍යාපෘති වාර්තාවක් ඉදිරිපත් කර ඇත. එලෙස ජාතික මට්ටමෙන් අපේක්ෂා කරන ප්‍රතිපාදනවලට අමතරව පළාත් සභාවේ අයවැය තුළින් පළාත් මාර්ග සංවර්ධනයට රු.මි.177.0ක් වෙන් කිරීමට මා යෝජනා කරමි.

**විදුලිබල හා විකල්ප බලශක්ති සංවර්ධනය**

පළාතේ පවතින විකල්ප බලශක්ති ප්‍රභවයන් ප්‍රවර්ධනය කිරීම තුළින් ජාතික බලශක්ති උත්පාදනයට දායකත්වය සැපයීම සඳහා මෙන්ම සැමට විදුලිය සැපයීමේ ජාතික ප්‍රතිපත්තියට අත්වැලක් සපයමින් 2016 වර්ෂයේ දී මෙම අංශය යටතේ ඵලදායි වැඩසටහන් රැසක් ක්‍රියාත්මක කරන ලදී. බලශක්ති නාස්තිය අවම කිරීමේ අරමුණින් බලශක්ති සංරක්ෂණය පිළිබඳ පාසල් ළමුන් දැනුවත් කිරීම, රාජ්‍ය ආයතනවල බලශක්ති කළමනාකරණය සඳහා විගණනය සිදු කිරීම, විකල්ප බලශක්ති භාවිතය ප්‍රචලිත කිරීම සහ බලශක්ති කාර්යක්ෂමතාවය ඇති කිරීම යනාදී කටයුතු ඉටු කරන ලදී. අමාත්‍යාංශ පරිශ්‍රයේ ජීව වායු ඒකකයක්, විකල්ප බලශක්ති පිළිබඳ ආදර්ශ ඒකකයක් ලෙස ස්ථාපිත කිරීම හා රු.මි.4.479 ක වියදමින් අමාත්‍යාංශ පරිශ්‍රයේ සූර්ය පැනලයක් ස්ථාපිත කිරීම සඳහා කටයුතු කරන ලදී. එමෙන්ම භූගෝලීය දුෂ්කරතා හා වෙනත් සාධක හේතුවෙන් ජාතික විදුලි පද්ධතියෙන් බැහැරවන හුදකලා ප්‍රදේශවල පවුල් සඳහා විදුලි දිගු ලබාදීමේ වැඩසටහන ද ක්‍රියාත්මක කරන ලදී.

එක්සත් ජාතීන්ගේ සංවර්ධන වැඩසටහනේ සුනිත්‍ය බලශක්ති අධිකාරිය හා අමාත්‍යාංශය එක්ව ගෝලීය පාරිසරික අරමුදලේ මූල්‍ය දායකත්වය ඇතිව හරිතාගාර වායු විමෝචනය අවම කිරීමේ ජාතික වශයෙන් යෝග්‍ය ක්‍රියාමාර්ග සඳහා වූ ව්‍යාපෘතිය (NAMA) යටතේ 2016 වර්ෂයේ දී ජීව වායු ඒකක 100 ක් මධ්‍යම පළාත තුළ ස්ථාපිත කිරීමට කටයුතු කර ඇත.

ගුණාත්මක බලශක්ති භාවිතය දිරි ගැන්වීම සඳහා ඉදිරියේ දී වැඩසටහන් රැසක් ක්‍රියාත්මක කළයුතුව ඇති අතර, සූර්ය පැනල ලබාදීම, විකල්ප බලශක්තිය පිළිබඳ පාසල් ළමුන් දැනුවත් කිරීම, බලශක්ති සංරක්ෂණය හා පුනර්ජනනීය බලශක්ති ප්‍රවර්ධනය රාජ්‍ය ආයතනවල බලශක්ති කළමනාකරණය යනාදී ව්‍යාපෘති ක්‍රියාත්මක කළ යුතු වේ. මේ අනුව 2017 වර්ෂය සඳහා රු.මි.5.0ක් වෙන් කරදීමට මා යෝජනා කරමි.

## මගී ප්‍රවාහන සේවා සංවර්ධනය

පළාතේ ජනතාවට තෘප්තිමත්, කාර්යක්ෂම හා ප්‍රශස්ථ මගී ප්‍රවාහන සේවාවක් සැපයීම සඳහා 2016 වර්ෂයේ මගී ප්‍රවාහන සේවා අධිකාරියට වෙන් වූ ප්‍රාග්ධන ප්‍රතිපාදන මගින් යටිතල පහසුකම් සංවර්ධනය යටතේ බස් නැවතුම්පල අලුත්වැඩියාව, වේලා සටහන් මැදිරි ඉදිකිරීම, මගී ආවරණ ඉදිකිරීම යන වැඩසටහන් ක්‍රියාත්මක කරන ලදී.

මධ්‍යම පළාතේ පොදු මගී ප්‍රවාහනය තුළ ව්‍යුහාත්මක ප්‍රතිසංස්කරණ සිදුකිරීම තුළින් බස් ධාවනය විධිමත් කිරීම හා මගී ජනතාව සඳහා කාර්යක්ෂම මගී ප්‍රවාහන සේවාවක් ලබාදීමේ අරමුණින් "සහසර නියමු ව්‍යාපෘතිය" අතිගරු ජනාධිපතිතුමන් අතින් 2016 වරෂයේ දී ආරම්භ කිරීමට ලැබීම මධ්‍යම පළාත ලද සුවිශේෂී ජයග්‍රහණයකි. මෙම ව්‍යාපෘතිය පිළිබඳ මගී ජනතාවගේ ඉහළ ප්‍රසාදයක් පවතින බව සිදුකරන ලද සමීක්ෂණ මගින් අනාවරණය වී ඇත.

මෙම වැඩසටහන පළාත තුළ තවදුරටත් ව්‍යාප්ත කිරීමටත්, ප්‍රවාහන සේවාවේ ගුණාත්මකභාවය නංවාලීමට අදාළ වැඩසටහන් ක්‍රියාත්මක කිරීමටත් කටයුතු කළ යුතු වේ. මෙම කාර්යයන් වෙනුවෙන් 2017 වර්ෂයට රු.මි. 8.0ක් වෙන් කිරීමට මා යෝජනා කරමි.

## පළාත් නිවාස දෙපාර්තමේන්තුව

පළාතේ අත්‍යවශ්‍ය ජන කොටස් සඳහා නිවසක හිමිකම ලබාදීම සහතික කිරීම සඳහා වූ පළාත් නිවාස දෙපාර්තමේන්තුවේ මෙහෙවර ඉටු කරමින් 2016 වර්ෂයේ වෙන් වූ රු. මි. 9.0ක ප්‍රතිපාදන මගින් අඩු ආදායම්ලාභී පවුල් සඳහා නිවාස ඉදි කිරීමට ද්‍රව්‍ය ආධාර හා මූල්‍ය ආධාර ලබාදීම,

නිවාස අවශ්‍යතාවය ඇති ජනතාව සඳහා අඩු වියදමින් නිවාස ඉදිකිරීම පිළිබඳ දැනුවත් කිරීමේ වැඩසටහන් පැවැත්වීම ක්‍රියාත්මක කරන ලද විශේෂ වැඩසටහන් වේ. මෙම ව්‍යාපෘති අඛණ්ඩව වැඩිදියුණු කරමින් පවත්වාගෙන යාම සඳහා 2017 වර්ෂයට රු.මි. 3.0ක් වෙන් කිරීමට යෝජනා කරමි.

## පළාත් ප්‍රවාහන කටයුතු සංවර්ධනය

පළාත් වාහන ආදායම් බලපත්‍ර නිකුත් කිරීමේ ප්‍රධාන වගකීම පැවරී ඇති මෙම දෙපාර්තමේන්තුව එම කාර්යය මගින් 2015 වර්ෂයේ දී පළාතට උපයා දී ඇති ආදායම රු.මි. 1,025 කි. මෙම කාර්යය කාර්යක්ෂම කිරීමත්, වඩාත් වේගවත් සේවාවක් ලබාදීමත් අරමුණු කරගෙන මධ්‍යම පළාත් ප්‍රවාහන දෙපාර්තමේන්තුව ඇතුළු පළාතේ ප්‍රාදේශීය ලේකම් කාර්යාල 36 හි ඕනෑම ප්‍රාදේශීය ලේකම් කාර්යාලයකින් මධ්‍යම පළාතේ ලියාපදිංචි වාහන සඳහා ආදායම් බලපත්‍ර ලබා ගැනීමේ පහසුකම් ඇති කිරීම සඳහා විද්‍යුත් ආදායම් බලපත්‍ර නිකුත් කිරීමේ වැඩසටහන 2016 වර්ෂයේ දී ආරම්භ කරන ලදී. “ප්‍රවාහන සතිය” වැඩසටහන තුළින් අපේක්ෂිත අරමුණු ඉටු කර ගැනීමට හැකිවූ අතර, මෙම කටයුතු වඩාත් ඉහළ මට්ටමින් පවත්වාගෙන යාම සඳහා 2017 වර්ෂයට රු.මි.2.0ක් වෙන් කිරීමට මා යෝජනා කරමි.

## කලාපීය ආර්ථික සංවර්ධන ආයතනය (REDA)

මධ්‍යම පළාත් සභාවේ 2008 අංක 1 දරණ ප්‍රඥප්තිය මගින් ස්ථාපනය කරන ලද කලාපීය ආර්ථික සංවර්ධන ආයතනය (REDA) රාජ්‍ය හා පෞද්ගලික අංශවල උපරිම දායකත්වය ලබා ගනිමින් ප්‍රාදේශීය ආර්ථිකය ඉහළ නැංවීමට අවශ්‍ය පසුබිම නිර්මාණය කිරීම සඳහා අදාළ කාර්යයන් ඉටු කර තිබෙනවා. ඒ අනුව මධ්‍යම පළාතේ ආයෝජනය ප්‍රවර්ධනය, කලාපයේ සුළු, කුඩා, මධ්‍යම හා මහා පරිමාණ ව්‍යාපෘති ප්‍රවර්ධනය මෙන්ම රාජ්‍ය සහ පෞද්ගලික සහභාගිත්ව සංවර්ධන වැඩසටහන් ක්‍රියාත්මක කරනු ලබනවා. තවද මධ්‍යම පළාත තුළ හා ඉන් බැහැරව විවිධ වූ සේවාවන් සම්බන්ධීකරණය කරනු ලබන සේවා කවුළුවක් ලෙස ද මෙම ආයතනය කටයුතු කරනවා. 2016 වර්ෂයේදී සංචාරක ක්ෂේත්‍රයේ දියුණුවට අදාළ

වැඩසටහන්, සමාජ ව්‍යවසායකත්ව වැඩසටහන්, දිවි නැගුම දෙපාර්තමේන්තුව, ශ්‍රී ලංකා මහවැලි අධිකාරිය හා මහනුවර කේම්බ්‍රිජ් ආයතනය වැනි බාහිර ආයතන හා ඒකාබද්ධ වූ වැඩසටහන්, රැකියා උත්පාදන වැඩසටහන්, මී මැසි පාලනය, අලෙවි ප්‍රවර්ධනය, කාන්තා නිමි ඇඳුම් පාඨමාලා, ගම්මිරිස් සෝස් ව්‍යාපෘතිය සහ වෙනත් ආදායම් උත්පාදන වැඩසටහන් ක්‍රියාත්මක කර තිබෙනවා. මේ තුළින් ප්‍රතිලාභීන් 1,500කට වැඩි පිරිසකට සෘජුවම ප්‍රතිලාභ අත්කර දී ඇති අතර, තවත් බොහෝ පිරිසකට වක්‍ර ප්‍රතිලාභ ලැබී තිබෙනවා. 2017 වර්ෂයේදී  සංචාරක, කෘෂිකර්ම, මානව සම්පත් සංවර්ධනය, සුළු, කුඩා හා මධ්‍ය පරිමාණ කර්මාන්ත සංවර්ධනය, නිෂ්පාදන අංශය වැඩිදියුණු කිරීම, වෙළඳපල ප්‍රවර්ධනය හා වෙළඳ ප්‍රදර්ශන, ව්‍යවසායකත්ව වැඩසටහන්, රැකියා උත්පාදන වැඩසටහන් මෙන්ම විදේශ ව්‍යාපෘති සම්බන්ධීකරණ වැඩසටහන් ක්‍රියාත්මක කිරීම කෙරෙහි අවධානය යොමුව තිබෙනවා. මෙම ආයතනයට පළාත් සභාවේ අයවැය තුළින් කිසිදු සංවර්ධන මුදලක් අප ලබා දෙන්නේ නැහැ. මොවුන් විසින් උපයා ගන්නා මුදලින් වැඩසටහන් ක්‍රියාත්මක කරනවා. පළාතේ සංවර්ධනය උදෙසා ඉටු කෙරෙන මෙම කාර්යභාරය අගය කළ යුතු වෙනවා.

**ප්‍රධාන ලේකම් කාර්යාලය**

ගරු සභාපතිතුමනි,

2017 වර්ෂය සඳහා විමධ්‍යගත අයවැය වැඩසටහන යටතේ රු.මි. 145.0ක්, ගරු මන්ත්‍රීතුමන්ලා සහ මන්ත්‍රීතුමියන්ලා අතර රු.මි. 2.5 බැගින් වෙන් කිරීමට යෝජනා කරන අතර, ඒ සඳහා, මහජනතාවගෙන් ලැබෙන යෝජනා අතරින් වඩා ඉහළ උපයෝගීතාවයකින් යුතු ව්‍යාපෘති යෝජනා තෝරාගෙන ක්‍රියාත්මක කිරීමට මේ ගරු සභාවට මා යෝජනා කරනවා. එසේම, මෙම යෝජනා හැකි උපරිමයෙන් පළාත් සභාවේ අමාත්‍යාංශ හා දෙපාර්තමේන්තු මගින් ක්‍රියාත්මක කිරීමට කටයුතු කරන ලෙස ද මා ඉල්ලා සිටිනවා.

පළාතේ අඩු සංවර්ධනයක් දක්නට ලැබෙන පසුගාමී හා හුදකලා ගම්මාන දියුණු කිරීම සඳහා අවශ්‍ය යටිතල පහසුකම් සංවර්ධනය වෙනුවෙන් රු.මි. 120.0ක් වෙන් කර දීමට යෝජනා කරන අතර, විශේෂ ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම සඳහා රු.මි.20.0ක් ද වෙන් කර දීමට යෝජනා කරමි.

පසුගිය වසරවල අප ලැබූ අත්දැකීම් මත ඇතැම් අවස්ථාවලදී හදිසි සංවර්ධන වැඩසටහන් සහ වෙනත් පොදු සේවාවන් සහ ව්‍යාපෘතීන් ක්‍රියාත්මක කිරීම සඳහා යම් පමණක ප්‍රතිපාදන වෙන් කර තිබීම ඉතා වැදගත් බව අපගේ හැගීමයි. ඒ අනුව 2017 මුදල් වර්ෂය සඳහා ප්‍රධාන ලේකම් කාර්යාලය ඇතුළු සියලු අමාත්‍යාංශ සඳහා රු.මි. 1.5 බැගින් හදිසි සංවර්ධන කටයුතු හා වෙනත් පොදු ව්‍යාපෘති සඳහා රු.මි. 9.0ක් වෙන් කරදීමට යෝජනා කරමි.

මහා භාණ්ඩාගාරය මගින් 2017 වර්ෂයට වෙන්කර දුන් මුදල, මුදල් කොමිෂන් සභාව විසින් සඳහන් කර ඇති පරිදිම මා දැඩි වෙහෙසක් දරා, ඒ ඒ විෂය පථයේ බර තැබීම අනුව ඉහත පරිදි වෙන් කිරීමට කටයුතු කරන ලද බව කිව යුතුයි.

**පරිපාලනය හා මූල්‍ය කළමනාකරණය**

මූල්‍ය කළමනාකරණයේ දී අප මුහුණදෙන ප්‍රධානතම අභියෝගය වන්නේ ජනතාවගේ අවශ්‍යතා කාර්යක්ෂමව ඉටු කරදීමට හැකිවන පරිදි මනා මූල්‍ය කළමනාකරණයක් පවත්වාගෙන යාමත්, පවතින මූල්‍ය සම්පත් ප්‍රශස්ථ ලෙස යොදා ගැනීමත්. අතිරේක මූල්‍ය සම්පාදන මාර්ග ඇති කර ගැනීමත්ය. මේ සඳහා යථාර්තවාදී අයවැයකරණය, ප්‍රශස්ත මූල්‍ය කළමනාකරණය හා දත්ත ගිණුම්ගත කිරීම මගින් විශ්වාසදායි මූල්‍ය වාර්තාකරණයකට අප පළාත් සභාව නිරන්තරයෙන් බැඳී සිටිනවා. පළාත් සභාවේ පුනරාවර්තන වියදම් අප සභාවෙන් උපයාගත් ආදායමෙන් ද, ඉතිරිය මහා භාණ්ඩාගාරයෙන් ද ලබා ගැනීමට කටයුතු කළ යුතු වෙනවා. එසේම, පළාතේ සංවර්ධන කාර්යය වෙනුවෙන් මහා භාණ්ඩාගාරයෙන් වෙන්කර දෙන උපමාන පාදක හා පළාත් නිශ්චිත සංවර්ධන ප්‍රදානයන් ඇතුළු පළාතේ සංවර්ධන කාර්යයන් සඳහා වූ සියලු අරමුදල් හා ප්‍රතිපාදන නිවැරදි කළමනාකාරිත්වයෙන් යුතුව ආයෝජනය කිරීම සඳහා කටයුතු කර තිබෙනවා.

ගරු සභාපතිතුමනි,

පළාත තුළ ජනතා හිතවාදි, කාර්යක්ෂම රාජ්‍ය සේවයක් ස්ථාපිත කිරීම සඳහා රාජ්‍ය නිලධාරීන්ගේ දැනුම, කුසලතා හා ආකල්ප සංවර්ධන කරමින්

යාවත්කාලීනව පවත්වාගෙන යා යුතුව තිබෙනවා. මේ සඳහා ඔවුන් නිරන්තර පුහුණු වැඩමුළු වෙත යොමු කළ යුතු වේ. විෂයානුබද්ධ දැනුම, නව සංකල්පිත තාක්‍ෂණික කාලීන දැනුම මෙන්ම ඵලදායිතා වැඩසටහන්, රාජ්‍ය භාෂා පුහුණු වැඩසටහන් සහ පශ්චාත් උපාධි සඳහා යොමු කිරීමට අදාළ කටයුතු සඳහා 2016 වර්ෂයේදී රු.මි. 15.0ක් වෙන් කර දෙමින්, රාජ්‍ය නිලධාරීන් 10,000 ට ආසන්න පිරිසකට ප්‍රතිලාභ අත්කර දී තිබෙනවා. එසේම 2017 වර්ෂයේදී ද නවමු පුහුණු මෙවලම් උපයෝජනයෙන් නූතන ක්‍රමවේද ඔස්සේ නව ආරක වැඩසටහන් රැසක් දියත් කිරීමට අපේක්‍ෂා කරන අතර, මෙම කටයුතු වෙනුවෙන් 2017 වර්ෂය සඳහා රු.මි. 5.0ක් වෙන් කර දීමට යෝජනා කරමි.

මෙම වසරේ මධ්‍යම පළාතේ සමාජ ආර්ථික සංවර්ධනය වෙනුවෙන් වෙන් වූ මුදල තුළ ඔබ අප සියලුදෙනා ක්‍රියා කළ ආකාරයත්, 2017 වර්ෂය සඳහා අප වෙත ලැබී තිබෙන මුදල් ප්‍රතිපාදන බෙදා දීම පිළිබඳවත් මාගේ කතාවෙන් ඔබට මනා අවබෝධයක් ලැබෙන්නට ඇතැයි සිතමි.

## පළාතේ ආදායම් උපයා ගැනීම සහ පුනරාවර්තන වියදම් සපුරා ගැනීම

මෙම වර්ෂයේ දී පළාත් සභාවේ පුනරාවර්තන වියදම් වෙනුවෙන් වෙන් කර දෙනු ලැබූ රු.මි.23,375ක මුදලට අමතරව පුනරාවර්තන වියදම් වෙනුවෙන් පළාතේ ආදායම් ලෙස රු.මි.6,044ක් උපයා ගත යුතුව තිබුණා. එමෙන්ම 2017 වර්ෂයේ සමස්ත පුනරාවර්තන වියදම ලෙස අප විසින් ඇස්තමේන්තු කර තිබූ මුදල රු.මි 32,800ක් වෙනවා. නමුත් අපට වෙන් කර දී තිබෙන්නේ රු.මි.29,943ක මුදලක් පමණි. මෙයින් පෞද්ගලික පඩි නඩි සඳහා රු.මි. 26,280ක් වැය වෙනවා. මෙම වියදම කෙසේවත් අඩු කරන්න හෝ කපා හරින්න අපිට හැකියාවක් නැහැ. ඒ අනුව වැටුප් හා වේතන හැර අනෙකුත් පුනරාවර්තන වියදම් වෙනුවෙන් අප අපේක්ෂා කළ මුදල රු.මි. 6,520ක් වුවත් ඒ සඳහා අපට ලැබී තිබෙන මුදල රු.මි.3,663ක් වෙනවා. ඇස්තමේන්තුව අනුව හිග මුදල රු.මි. 2,857ක් වෙනවා. ඒ අනුව 2017 වර්ෂයේ අපේ ආයතනවල කටයුතු වඩාත් අරපිරිමැසුම් සහිතව අත්‍යවශ්‍යම වියදම් පමණක් දරමින් පවත්වාගෙන යා යුතු වෙනවා. සියලුම අමාත්‍යාංශ, දෙපාර්තමේන්තු හා ආයතන 2017 වර්ෂයේ සංවර්ධන මුදල් හා

පුනරාවර්තන මුදල් ඉතාමත් අරපිරිමැස්මෙන් යුතුව වසර පුරාවට ආයතන සුමටව පවත්වාගෙන යාමට හැකිවන ලෙස කළමනාකරණය කර ගන්නා ලෙස දේශපාලන නායකවයෙන් හා පරිපාලනය භාර සෑමදෙනාගෙන් පොදුවේ මා ඉල්ලා සිටිනවා.

2017 වර්ෂයේ තවත් අභියෝගයකට අපට මුහුණ දීමට සිදුවී තිබෙනවා. මෙම වර්ෂයේ දී පළාත් අදායම් ලෙස අපට ලබා දී තිබු ඉලක්කය රු.මි.6,044ක් වුවත්, 2017 වර්ෂයේ දී එම ප්‍රමාණය රු.මි.7,454ක් ලෙස රු.මි. 1,410කින් වැඩිකර තිබෙනවා. මෙම මුදල පළාතේ අදායම් ලෙස අනිවාර්යෙන්ම අප උපයාගත යුතු වෙනවා. මන්ද එම මුදල අඩු කර පුනරාවර්තන වියදම්වලින් ඉතිරි ප්‍රමාණය පමණයි අපට මහා භාණ්ඩාගාරයෙන් 2017 වර්ෂයට ලැබෙන්නේ.

පළාත තුළින් උපයාගත යුතු ආදායම කාර්යක්ෂම ක්‍රමවේදයක් තුළින් අපේක්ෂිත ඉලක්ක ළගා කර ගැනීමට හැකිවන පරිදි විධිමත් වැඩ පිළිවෙලක් අනුව ක්‍රියාත්මක කිරීමට අදාළ ආයතන ප්‍රධානින් කටයුතු කළ යුතුය. ඉලක්ක සම්පූර්ණ කර ගන්නා ආයතනවල කාර්යක්ෂමතාවය හා ඵදායිතාවය ඇගයීමට ද මා අපේක්ෂා කරනවා.

මෙතෙක් වේලාවක් පුරාවට මා ඔබ වෙත ඉදිරිපත් කළ අයවැය කථාව අවසන් කරමින් අපගේ සියලු කටයුතුවලදී අවවාද, අනුශාසනා, උපදෙස්, මඟ පෙන්වීම් හා සහයෝගය ලබාදුන් සියලුදෙනා වෙත ස්තූතිය පුද කිරීමට මේ අවසාථාවේ දී බලාපොරොත්තු වෙනවා

ගරු සභාපතිතුමනි,

අප පළාතේ ජනතාවගේ මෙන්ම සමස්ත රටේ ජනතාවගේ සුබසිද්ධිය කෙරෙහි විශේෂ උනන්දුවක් දක්වා අර්ථයෙන් ධර්මයෙන් අනුශාසනා ලබාදෙමින් කටයුතු කරන අතිගරු මහනායක හිමිවරුන් ප්‍රමුඛ මහ සඟරුවන ඇතුළු සියලු අන්‍ය ආගමික නායක උතුමන් වෙත මාගේ

නමස්කාරපූර්වක ස්තූතිය මෙහිලා මුලින්ම පිරිනමමි. එසේම 2017 වර්ෂය සඳහා ද එකී සියලු ආශිර්වාද තුළින් පළාතේ වැඩිදියුණුව අපේක්ෂා කරමි.

එසේම, අප පළාත් සභාවේ කටයුතු සහ පළාතේ දියුණුව වෙනුවෙන් නිරන්තරව සොයා බලා උපදෙස් ලබාදෙන අතිගරු ජනාධිපති මෛත්‍රීපාල සිරිසේන මැතිතුමාටත්. ගරු අගමැති රනිල් වික්‍රමසිංහ මැතිතුමාටත් මාගේ ගෞරවනීය ස්තූතිය පිරිනමමි. එමෙන්ම අතිගරු ජනාධිපතිතුමන්ගේ නියෝජිතවරිය ලෙසත්, පළාතේ ප්‍රථම පුරවැසියා ලෙසත් අනුශාසනා සහ උපදෙස් ලබාදෙමින් පළාතේ සමාජ ආර්ථික සංවර්ධනය සඳහා නිරන්තර වෑයමක යෙදෙන ගරු ආණ්ඩුකාරවර නිලූකා ඒකනායක මැතිණියටත් මාගේ ගෞරව පූර්වක ස්තූතිය පිරිනමමි. එසේම, පළාත් සභාවේ කටයුතු අපක්ෂපාතීව ඉටු කරනු ලබන ගරු සභාපතිතුමාටත්, ගරු නියෝජ්‍ය සභාපතිතුමාටත්, ගරු අමාත්‍ය මණ්ඩලයටත්, ගරු විපක්ෂ නායිකාතුමියටත්, පක්ෂ, විපක්ෂ ගරු මන්ත්‍රී මණ්ඩලයටත් මාගේ කෘතඥතාපූර්වක ස්තූතිය පිරිනමමි.

2016 වර්ෂයේ කටයුතු වෙනුවෙන් පළාත් රාජ්‍ය සේවයේ සියලු නිලධාරින් මෙහෙයවමින්, මනාව මූල්‍ය කළමනාකරණය කරමින්, සංවර්ධන ව්‍යාපෘතිවල ප්‍රගතිය විමසා බලමින් සහ අඩුපාඩු නිවැරදි කරමින් කටයුතු කරන ප්‍රධාන ලේකම්තුමා, ආණ්ඩුකාර ලේකම්තුමා, රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ සභාපතිතුමා, ලේකම්තුමිය, සභා ලේකම් කාර්යාලයේ ලේකම්තුමා, අමාත්‍යංශ ලේකම්තුමන්ලා, නියෝජ්‍ය ප්‍රධාන ලේකම්තුමන්ලා, දෙපාර්තමේන්තු ප්‍රධානින් ඇතුළු සියලුම රාජ්‍ය නිලධාරින් වෙත ද මාගේ කෘතඥතාව පිරිනමමි.

තව ද, පළාත් සභාවේ කටයුතු විධිමත්ව පවත්වාගෙන යාමට සහයෝගය ලබාදුන් සභා ලේකම් කාර්යාලයේ කාර්ය මණ්ඩලයටත්, පළාත් සභාවේ සියලුම කටයුතු සාර්ථක කර ගැනීමට දායකත්වය ලබාදුන් ආරක්ෂක අංශවල සියලුදෙනාටත් මාගේ ස්තූතිය පිරිනමමි. ඉදිරි වර්ෂයේ දී ද ඔබ සැමගේ සක්‍රිය දායකත්වය මා අපේක්ෂා කරනවා.

එසේම, පළාත් සභාවේ සංවර්ධන කටයුතු බොහොමයක් ක්‍රියාත්මක කරනු ලබන හිටපු ගරු නගරාධිපතිවරුන්, ගරු ප්‍රාදේශීය සභා සභාපතිවරුන් හා

දිස්ත්‍රික් ලේකම්වරුන් තිදෙනා මෙන්ම ප්‍රාදේශීය ලේකම්වරුන් ඇතුළු කාර්ය මණ්ඩලවලට ද මාගේ ස්තූතිය පිරිනමමි.

මධ්‍යම පළාත් සභාවේ සංවර්ධන කටයුතු පළාතේ පොදු ජනතාවට සන්නිවේදනය කරනු පිණිස සියලු ශ්‍රව්‍ය දෘශ්‍ය මාධ්‍ය මගින් රටටම තොරතුරු සපයනු ලබන පළාතේ සියලු මාධ්‍යවේදී මහත්ම මහත්මීන්ට, ඔවුන්ගෙන් ඉටුවන මහඟු සේවාව වෙනුවෙන් මාගේ ස්තූතිය මෙහිලා පිරිනමමි. එසේම, මෙම වර්ෂයට වඩා ඔබ අප අතර මනා අවබෝධයකින් යුතුව සත්‍ය තොරතුරු තුලනාත්මකව සමාජයට අනාවරණය කිරීම සඳහා ජනමාධ්‍ය හිතවතුන්ගේ සහය මා ඉදිරි වර්ෂයටත් අපේක්ෂා කරනවා.

අවසාන වශයෙන් මධ්‍යම පළාතේ සමස්ත ප්‍රජාවගේ ජීවන තත්ත්වය නංවාලීමට, 2017 වර්ෂය සඳහා ඔබ සැමගේ සහයෝගය අපේක්ෂා කරමින් මාගේ  අයවැය කථාව අවසන් කරනවා.

ඔබ සැමට දළදා සමිදු පිහිටයි. සියලු දෙවි රැකවරණයි !

සරත් ඒකනායක
ප්‍රධාන අමාත්‍ය
මධ්‍යම පළාත් සභාව